වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

2022



කම්කරු දෙපාර්තමේන්තුව

தொழில் திணைக்களம்

Department of Labour

2022 වර්ෂය සඳහා

වාර්ෂික කාර්යසාධන වාර්තාව

වැය ශීර්ෂ අංක 221

කම්කරු දෙපාර්තමේන්තුව

සම්පාදනය
සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය

ප්‍රකාශනය
2023 අගෝස්තු
සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය
10 වන මහල, **"මෙහෙවර පියෙස"**
නාරාහේන්පිට
කොළඹ 05

මුද්‍රණය
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

පෙළගැස්ම

පිටුව

පළමු පරිච්ඡේදය ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය		**01**
1.1	හැඳින්වීම	02
1.2	දැක්ම, මෙහෙවර සහ අරමුණු	02
1.3	ප්‍රධාන කාර්යයන්	03
1.4	දෙපාර්තමේන්තුවේ ව්‍යුහය, සංවිධාන සටහන, ප්‍රධාන අංශ සහ සමස්ත කාර්ය මණ්ඩලය	04
1.5	දෙපාර්තමේන්තුවේ අංශ	07
1.6	දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්	17
දෙවන පරිච්ඡේදය ප්‍රගතිය හා ඉදිරි දැක්ම		**18**
2.1	ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා කාර්මික සාමය සුරක්ෂිත කිරීම	19
2.2	ශ්‍රම ප්‍රඥතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම	23
2.3	සේවකයාගේ වෘත්තීය සුරක්ෂිතතාවය සඳහා වූ සුනිසි වැඩ පරිසරය තහවුරු කිරීම	25
2.4	සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම්	27
2.5	සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම	28
2.6	සේවකයන්ගේ සමාජ ආරක්ෂණය	31
2.7	සේවකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා නෛතික රැකවරණය	34
2.8	දෙපාර්තමේන්තුවේ මානව සම්පත කළමනාකරණය	36
2.9	තොරතුරු සන්නිවේදන කටයුතු	39
2.10	දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මගින් ඉලක්කයන් වෙත මෙහෙයවීම	43
2.11	සුනිසි මෙහෙවර වැඩසටහන	44
2.12	මූල්‍ය කළමනාකරණය	44
2.13	විශේෂ ජයග්‍රහණ	45
2.14	ඉදිරි සැලසුම්	48

තුන්වන පරිච්ඡේදය **2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය**		**49**
3.1	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	50
3.2	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	51
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	53
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	54
3.5	ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය	54
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	55
3.7	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	55
3.8	මුදල් නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය	55
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	56
සිව්වන පරිච්ඡේදය කාර්යසාධන දර්ශක		**64**
4.1	ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	65
පස්වන පරිච්ඡේදය තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය		**66**
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	67
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	68
සයවන පරිච්ඡේදය මානව සම්පත් පැතිකඩ		**72**
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	73
6.2	ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය	73
6.3	මානව සම්පත් සංවර්ධනය	73
සත්වන පරිච්ඡේදය අනුකූලතා වාර්තාව		**86**
7.1	අනුකූලතා වාර්තාව	87

ප්‍රස්තාර

		පිටුව
ප්‍රස්තාරය 2.1	2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා නිරවුල් කිරීම්	21
ප්‍රස්තාරය 2.2	2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා නිරවුල් කිරීම්	21
ප්‍රස්තාරය 2.3	‘‘සේවක අර්ථසාධක අරමුදල් අයදුම්පත් භාරදීමට වේලාවක් වෙන් කරවා ගැනීමේ පද්ධතිය’’ මගින් වේලාවක් වෙන් කරවාගත් සංඛ්‍යාව - 2022.09.01 දින සිට 2022.12.31 දින දක්වා	32
ප්‍රස්තාරය 2.4	2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවූ සංඛ්‍යාව	32
ප්‍රස්තාරය 2.5	සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවීම සඳහා ගතවූ කාලය - 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා	33
ප්‍රස්තාරය 2.6	මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු - 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා	35

වගු

		පිටුව
වගුව 2.1	2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්	19
වගුව 2.2	පඩිපාලක සභාවල අවම වැටුප් යාවත් කාලීන කිරීම - 2022	23
වගුව 2.3	‘‘ නිදහසේ රන් දරුවෝ අරමුදල’’ මගින් ප්‍රතිලාභ ලබා දීමේ ප්‍රගතිය - 2022	30
වගුව 2.4	අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා	34
වගුව 2.5	කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම 2022	36
වගුව 2.6	2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් සඳහා සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන්	37
වගුව 2.7	2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා දෙපාර්තමේන්තුව විසින් බාහිර පුහුණු ආයතනයන්හි පුහුණුව සඳහා නිලධාරීන් වෙත ප්‍රතිපාදන ලබා දීම්	37
වගුව 2.8	සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය - 2022	44
වගුව 2.9	දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය - 2022	44
වගුව 6.1	දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2022	74
වගුව 6.2	විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2022	82

රූප සටහන්

පිටුව

රූප සටහන 2.1	පරීක්ෂණ සිදු කිරීම් - 2022 වර්ෂයේ ප්‍රගතිය	20
රූප සටහන 2.2	වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2022	22
රූප සටහන 2.3	2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ ඉටු කළ ක්‍රියාකාරකම්	26
රූප සටහන 2.4	2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ ඉටු කළ ක්‍රියාකාරකම්	27
රූප සටහන 2.5	2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා නිවේදන යැවීමේ ප්‍රගතිය	33

ඡායාරූප

පිටුව

ඡායාරූපය 2.1	“ නිදහසේ රන් දරුවෝ අරමුදල” මගින් ප්‍රතිලාභ ලබා දීමේ අවස්ථාවක්	30
ඡායාරූපය 2.2	“සේවක අර්ථසාධක අරමුදල් අයදුම්පත් භාරදීමට වේලාවක් වෙන් කරවා ගැනීමේ පද්ධතිය” ගරු අමාත්‍යතුමා විසින් ආරම්භ කල අවස්ථාව	31
ඡායාරූපය 2.3	රත්නපුර දී පවත්වන ලද විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නායකත්ව හා පෞරුෂ සංවර්ධන පුහුණු වැඩසටහන - 2022.03.25 සහ 26 දෙදින	38
ඡායාරූපය 2.4	ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සම්පත් දායකත්වය ලබා දුන් පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන -2022.03.28 දින	38
ඡායාරූපය 2.5	දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සේවා මට්ටමේ නිලධාරීන් සඳහා පවත්වන ලද දෙමළ භාෂා පුහුණු පාඨමාලාවේ අවසන් දින උත්සවය සහ සහතික ලබා දීම - 2022.09.13	38
ඡායාරූපය 2.6	අළුතින් ඉදි කර විවෘත කරන ලද හැටන් සහ බදුල්ල කම්කරු කාර්යාල ගොඩනැගිලි	39

පළමු පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

යටත් විජිත සමයේ බ්‍රිතාන්‍ය පාලකයන් විසින් ව්‍යාපාරික වතු වගාව යටතේ කෝපි හා තේ වගාව සඳහා ශ්‍රී ලංකාවට ගෙන්වන ලද ඉන්දීය කම්කරුවන්ට සුබසාධනය සැපයීමේ අරමුණින් 1923 අංක 01 දරන ඉන්දියානු ආගාමික කම්කරු ආඥා පනත හඳුන්වා දෙන ලදී. එම ආඥා පනත යටතේ පිහිටුවන ලද ඉන්දියානු ආගාමික කම්කරු පාලකවරයාගේ දෙපාර්තමේන්තුව කම්කරු දෙපාර්තමේන්තුවේ මූලාරම්භය වේ. වර්තමානයේදී කම්කරු දෙපාර්තමේන්තුව විසින් සේවය සේවක හා රජය යන ත්‍රෛපාර්ශවීය සම්බන්ධතාවය ශක්තිමත්ව පවත්වා ගැනීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමේ කාර්යභාරය ඉටු කරයි.

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවක ප්‍රජාවගේ වෘත්තීය හිමිකම් තහවුරු කිරීම, සමාජ ආරක්ෂණය ඇති කිරීම හා සේවය සේවක සබඳතාවයන් වර්ධනය කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ප්‍රමුඛ රාජ්‍ය ආයතනය කම්කරු දෙපාර්තමේන්තුව වේ. කම්කරු දෙපාර්තමේන්තුව විසින් කම්කරු විෂයට අදාළ අණ පනත් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය ප්‍රවර්ධනය කිරීම් සිදු කිරීම සඳහා දීප ව්‍යාප්තව කම්කරු කාර්යාල පවත්වා ගනිමින් තමන් වෙත පැවරී ඇති වගකීම ඉටු කරනු ලබයි.

1.2 දැක්ම, මෙහෙවර සහ අරමුණු



දැක්ම

“අන්තර්ජාතිකව තරඟකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක්”



මෙහෙවර

“කම්කරු අයිතීන් ආරක්ෂා කරමින්, තහවුරු කරන ලද කාර්මික සාමය සහිත සුනිසි වැඩ පරිසරයක් තුලින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම”



අරමුණු


- පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා ආයතන තුල ස්ථීරසාර කාර්මික සාමය තහවුරු කිරීම
- සුනිසි වැඩ පරිසරයක් ඇති කිරීම හා ශ්‍රම ප්‍රමිතීන් සකස් කිරීම මගින් සේවකයන්ගේ සේවා තත්ත්වය වැඩි දියුණු කිරීම
- සේවකයන්ගේ සමාජ ආරක්ෂණය තහවුරු කිරීම
- ස්ත්‍රීන් හා තරුණ අයගේ වෘත්තීමය සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ළමා ශ්‍රමය තුරන් කිරීම
- සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වයන්ට හිතකර හා අනතුරු රහිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

- ආයතන වල සේවකයන් හා සේවායෝජකයන් අතර කතිකාවත ප්‍රවර්ධනය කිරීම
- කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම හා සමාජ කතිකාවත ප්‍රවර්ධනය මගින් කාර්මික ආරවුල් ඇතිවීම වැළැක්වීම හා ඇතිවූ ආරවුල් නිරවුල් කිරීම
- ඵලදායීව කාලීන පරීක්ෂණ සිදු කිරීම සහ ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන්ට ඇවැසි දැනුම නිරන්තරව යාවත්කාලීන කිරීම මගින් සේවකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් තහවුරු කිරීම.
- සේව්‍ය සේවක දෙපාර්ශවය තුල කම්කරු නීති පිළිබඳව පවතින දැනුම හා අවබෝධය පුළුල් කිරීම තුලින් කාර්මික සාමය තහවුරු කිරීම.
- ජාතික ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් අනුව උචිත වන්නා වූ ශ්‍රම ප්‍රමිතීන්, අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව යමින් සැකසීම හා ක්‍රියාවට නැංවීම.
- සේවක අර්ථසාධක අරමුදල මනා ලෙස පරිපාලනය කිරීම තුළින් හිමිකරුවන්ට ප්‍රතිලාභ නියමිත පරිදි ලබා දීම තහවුරු කිරීම සහ එපරිදිම අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් හා විශ්‍රාම දීමනා ක්‍රම පිළිබඳ පරිපාලනය.
- කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ කම්කරු නීති ඇතුලු සියලු කම්කරු නීති සාධනීය ලෙස ක්‍රියාවට නැංවීම
- වැඩ බිම තුළ සෞඛ්‍ය ආරක්ෂිත බව හා අනතුරු රහිත බව පිළිබඳව සේවකයන් දැනුවත් කිරීම, සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම හා අනතුරු රහිත බව තහවුරු කිරීම.
- ඉහත කාර්යයන් සඳහා තීරණ ගැනීමට අවශ්‍ය සංඛ්‍යාලේඛන දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය.
- ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් නීතියෙන් හා භාවිතයෙන් බලාත්මක කිරීමට කටයුතු කිරීම.
- ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය තුරන් කිරීමට කටයුතු කිරීම.

1.4 දෙපාර්තමේන්තුවේ ව්‍යුහය, සංවිධාන සටහන, ප්‍රධාන අංශ සහ සමස්ත කාර්ය මණ්ඩලය

1.4.1 දෙපාර්තමේන්තුවේ ව්‍යුහය




1.4.2 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

✓ කාර්මික සම්බන්ධතා අංශය	✓ සේවක අර්ථසාධක අරමුදල් අංශය
✓ මානව සම්පත් සංවර්ධන අංශය	✓ නීති ක්‍රියා අංශය
✓ විශේෂ විමර්ශන අංශය	✓ පාලන අංශය
✓ ශ්‍රම ප්‍රමිති අංශය	✓ මුදල් අංශය
✓ කර්මාන්තමය සුරක්ෂිතතා අංශය	✓ සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය
✓ වෘත්තීය ස්වස්ථතා අංශය	✓ සංඛ්‍යාලේඛන අංශය
✓ කාන්තා හා ළමා කටයුතු අංශය	✓ අභ්‍යන්තර විගණන අංශය

1.4.3 දෙපාර්තමේන්තුවේ 2022.12.31 දිනට අනුමත සමස්ත කාර්ය මණ්ඩලය

තනතුර	අනුමත සංඛ්‍යාව	2022.12.31 දිනට තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව අනුමත සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස
ජ්‍යෙෂ්ඨ මට්ටම	211	133	78	37%
තෘතීය මට්ටම	668	478	190	28%
ද්විතීය මට්ටම	1753	1718	35	2%
ප්‍රාථමික මට්ටම	489	401	88	18%
එකතුව	3121	2730	391	13%

1.4.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

අන්තර්ජාතිකව තරඟකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම දෙපාර්තමේන්තුවෙහි දැක්ම වන හෙයින් කාර්මික සාමය පවත්වා ගැනීම දෙපාර්තමේන්තුවේ මූලික හා අත්‍යවශ්‍ය කාර්යය වේ. මේ සඳහා සේවා සේවක දෙපාර්ශවය අතර කතිකාවක් පවත්වාගෙන යාම, සේවා ස්ථාන පරීක්ෂා කිරීම, ව්‍යවස්ථාපිත හිමිකම් අහිමිවීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම, වැඩ බිම තුළ අනතුරු රහිත බව තහවුරු කිරීම, සේවකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම යන ප්‍රධාන කාර්යයන් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි.

ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව පහත අංශ ක්‍රියාත්මක වේ.

1.5.1. කාර්මික සම්බන්ධතා අංශය
1.5.2. මානව සම්පත් සංවර්ධන අංශය
1.5.3. විශේෂ විමර්ශන අංශය
1.5.4. ශ්‍රම ප්‍රමිති අංශය
1.5.5. කර්මාන්තමය සුරක්ෂිතතා අංශය
1.5.6. වෘත්තීය ස්වස්ථතා අංශය
1.5.7. කාන්තා හා ළමා කටයුතු අංශය
1.5.8. සේවක අර්ථසාධක අරමුදල් අංශය
1.5.9. නීති ක්‍රියා අංශය
1.5.10. පාලන අංශය
1.5.11. මුදල් අංශය
1.5.12. සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය
1.5.13. සංඛ්‍යාලේඛන අංශය
1.5.14. අභ්‍යන්තර විගණන අංශය

එසේම, දිවයින පුරා විසිරී සිටින කම්කරු ප්‍රජාව වෙත අපේක්ෂිත සේවා පහසුකම් සැලසීමේ අරමුණින් කලාප කම්කරු කාර්යාල 11ක් ද, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක් ද, උප කම්කරු කාර්යාල 17 ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක් ද කම්කරු දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කිරීම යටතේ, දිවයින පුරා පිහිටුවා සේවා සපයනු ලැබේ.

ඉහත සඳහන් එක් එක් අංශයන්හි කාර්යභාරය පහත පරිදි වේ.

1.5.1 කාර්මික සම්බන්ධතා අංශය

සේවක අයිතීන් ආරක්ෂා කරමින් රට තුළ කාර්මික සාමය ඇතිකර රටේ ආර්ථික වර්ධනයට සහ සංවර්ධනයට දායක වීමේ වගකීම කාර්මික සම්බන්ධතා අංශය මගින් දරනු ලබයි. මේ සඳහා කාර්මික සම්බන්ධතා අංශය යටතේ සේවය අවසන් කිරීමේ අංශය සහ වෘත්තීය සමිති අංශය ක්‍රියාත්මක වන අතර කාර්මික අධිකරණයේ සම්බන්ධීකරණ කටයුතුද සිදු කරනුලබයි.

ඒ අනුව, ආර්ථික ඵලදායීතාවය නංවාලීම සඳහා අවශ්‍ය කාර්මික සාමය ඇති කිරීම, කම්කරු අණපනත් වලින් නියමකර ඇති සේවා කොන්දේසි හා සේවා තත්ත්වයන් ආරක්ෂා කිරීම, සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම හා එය ප්‍රවර්ධනය කිරීම, වැඩ වර්ජන හා කාර්මික ආරවුල් අවම කිරීම සහ වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ නියාමනය කිරීම මෙම අංශයේ ප්‍රධාන අරමුණු වේ.

මෙම අංශය මගින් පහත නෛතික විධිවිධාන බලාත්මක කෙරනු ලැබේ

- 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත
- 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත
- 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
- 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත
- 2021 අංක 28 දරන සේවකයන් විශ්‍රාම යාමේ අවම වයස පනත

1.5.2 මානව සම්පත් සංවර්ධන අංශය

දිවයින පුරා විසිරී ඇති පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවල උපරිම ඵලදායීතාව හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ඉටු කිරීම මානව සම්පත් සංවර්ධන අංශය මගින් සිදු කෙරේ. ඒ අනුව එම අංශය විසින් පහත කටයුතු සිදු කරනු ලබයි.

1.5.2.1 සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම සඳහා වන ප්‍රතිපත්ති හා උපාය මාර්ග හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනික මට්ටමෙන් වැඩපොළ සහයෝගීතාව ගොඩනැගීම
1.5.2.2 සාමූහික ගිවිසුම් ඇති කිරීම සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස ක්‍රියා කරමින් කාර්මික සාමය ගොඩනැගීම
1.5.2.3 යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතන දැනුවත් කිරීමේ වැඩ සටහන් තුළින් සේවා සේවක දෙපාර්ශවය කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම (මේ සඳහා ආයතන මට්ටමේ වැඩසටහන් සහ කළමනාකරුවන් හා සේවායෝජකයින් සඳහා වන වැඩසටහන් සංවිධානය කොට පවත්වනු ලබයි.)
1.5.2.4 සේවා සේවක දෙපාර්ශවය හා නියෝජ්‍ය / සහකාර කම්කරු කොමසාරිස්වරුන්ගේ සහභාගිත්වයෙන් ප්‍රාදේශීය කම්කරු කාර්යාල හරහා කම්කරු දෙපාර්තමේන්තුවේ ත්‍රෛපාර්ශවීය

සබඳතාවය ගොඩනැගීම සහ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීමට කලාප / දිස්ත්‍රික් කම්කරු උපදේශන සභා පැවැත්වීම.

1.5.2.5 දැනුම බෙදා හදා ගැනීමටත් සේවායෝජක සේවක දෙපාර්ශවය අතර කම්කරු නීති, පිළිබඳව පවතින ගැටලු නිරාකරණය කිරීමටත් කලාප කතිකාවත පැවැත්වීම.

1.5.2.6 කාර්මික ආරවුල් ඇතිවීම වැළැක්වීම සඳහා දැනුම වර්ධනය කිරීමට කතිකාව සඟරාව එළි දැක්වීම.

1.5.2.7 සමාජ කතිකාව කොතරම් දුරට ආයතන තුළ තහවුරු වී තිබේද යන්න පිළිබඳව වාර්ෂිකව නිෂ්පාදන, සේවා, ඇඟළුම් හා වැවිලි අංශය නියෝජනය වන පරිදි කුඩා, මධ්‍ය හා මහා පරිමාණ වශයෙන් දීප ව්‍යාප්තව සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගිතාවය පිළිබඳ තරඟාවලියක් පැවැත්වීමට කටයුතු කිරීම සහ ඊට සමගාමීව සමාජ කතිකාව සහ වැඩපොළ සහයෝගිතාවය පිළිබඳ ගද්‍ය රචනා හා පද්‍ය රචනා (සිංහල / දෙමළ), චිත්‍ර, පෝස්ටර් හා කෙටි වීඩියෝ නිර්මාණ තරඟාවලියක් පැවැත්වීම.

1.5.3 විශේෂ විමර්ශන අංශය

සාමාන්‍ය පරිදි සිදු කෙරෙන කම්කරු පරීක්ෂණ සහ පැමිණිලි පරීක්ෂණවලට අමතරව, යම් පැමිණිලි විමර්ශනයක් හෝ යම් ආයතනයක සිදු කරන ලද පරීක්ෂණයක් සිදුවූ ආකාරය පිළිබඳ සෑහීමට පත්නොවන අයකු විසින් ස්වාධීන පරීක්ෂණයක් නැවත ලබාගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත කරනු ලබන ඉල්ලීම් අවශ්‍යතාවය පරිදි විශේෂ විමර්ශණ අංශය වෙත යොමු කරනු ලැබේ. කම්කරු කොමසාරිස් ජනරාල්ගේ නියෝග සහිතව ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක විමර්ශන කිරීමේ බලය මෙම අංශයට පවතීන අතර මෙම අංශය විසින් හදිසි හාක්ෂණික පරීක්ෂණ සහ විශේෂ විමර්ශන රාජකාරී කටයුතු වල යෙදෙනු ලැබේ.

1.5.4 ශ්‍රම ප්‍රමිති අංශය

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුභසාධනය කෙරෙහි බලපාන්නා වූ වැටුප්, සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා ඒවාට නෛතික තත්ත්වය ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාවලියකි. සේවා තත්ත්වයන් හා කොන්දේසිවලට අදාළව පැන නගින ගැටළු සහගත තත්ත්වයන් නිරාකරණය කරගැනීමෙහිලා ඊට අදාළ පැහැදිලි කිරීම් ලබා දීමද ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමෙහිලා ඇති ප්‍රගතිය මෙන්ම අධීක්ෂණ කාර්යය ද ඉටු කිරීම මගින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීමමෙම කාර්යාවලියේ අත්‍යවශ්‍ය කොටසක් වන අතර, මෙම සමස්ත වගකීම ඉටු කිරීම දෙපාර්තමේන්තුවේ ශ්‍රම ප්‍රමිති අංශය විසින් සිදු කරනු ලැබේ.

මෙම අංශය මගින් පහත නෛතික විධිවිධාන බලාත්මක කෙරනු ලැබේ

- 1941 අංක 27 දරන පඩිපාලක සහා ආඥා පනත
- 1954 අංක 19 දරන සාජ්පු හා කාර්යාල (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත
- 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත
- 2016 අංක 03 දරන ජාතික අවම වේතන පනත
- 2016 අංක 04 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත

1.5.5 කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

කර්මාන්තශාලා තුල සේවයෙහි යෙදෙන ශ්‍රමිකයන් හට භෞතිකමය වශයෙන් යම් ශාරීරික හානි සිදුවීම්, විදුලිය, තාපය, වායු පීඩනය, අධික ආලෝකය හා ශබ්දය මගින් ශාරීරික හානි හෝ මරණය පවා සිදුවීමේ අවධානමක් පවතී. එබැවින්, අනතුරු ඇති වීම අවම කිරීම **කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ** වගකීම වේ. ලංකාවේ කර්මාන්තශාලාවල සේවය කරන සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුභසාධනයට අදාළ ප්‍රධානම නීතිමය මෙවලමක් වනුයේ වර්ෂ 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත හා එයට අනුකූලව සම්මතකර ඇති රෙගුලාසින්ය. උපද්‍රව රහිත සේවා පරිසරයක් ඇති කිරීම මගින් අනතුරු පිළිබඳ බියකින් තොර ආරක්ෂිත ශ්‍රම බලකායක් බිහි කිරීම මගින් සේවා ස්ථාන වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් එමගින් දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමත් ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය ඉහළ නැංවීමත් අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි පිහිටුවා ඇති දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10හි සේවයේ නියුතු ඉංජිනේරුවරු විසින් කර්මාන්තශාලා පරීක්ෂා කර මෙම කාර්ය ඉටු කරනු ලබන අතර, කම්කරු නිලධාරීන් විසින් කරනු ලබන කම්කරු පරීක්ෂණ වලදී හඳුනා ගැනෙන අනතුරුදායක තත්ත්වයන් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල වෙත වාර්තා කරනු ලබන හෙයින් එම තොරතුරුද භාවිත කොට සේවක ආරක්ෂාව සැලසීම කරනු ලබයි.

මූලික වශයෙන් කර්මාන්තමය සුරක්ෂිතතාව සැලසීම සඳහා පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

1.5.5.1 නව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම

1.5.5.2 ගොඩනැගිලි පිඹුරුපත් පරීක්ෂා කිරීම හා අනුමත කිරීම

1.5.5.3 කර්මාන්තශාලා පරීක්ෂා කිරීම

1.5.5.4 අනතුරු විමර්ශනය සහ අන්තරාදායී සිදුවීම් විමර්ශනය

1.5.5.5 නීතිමය පියවර ගැනීම

1.5.5.6 අධි අන්තරාදායී යන්ත්‍ර පරීක්ෂාව නියාමනය කිරීම

1.5.5.7 පැමිණිලි විමර්ශනය

1.5.5.8 දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම

1.5.5.9 වෘත්තීය අනතුරු හා ලෙඩ රෝග වලට ගොදුරු වන්නන් කම්කරු වන්දි කොමසාරිස් හා ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීම

1.5.5.10 වෙනත් වැඩසටහන්

1.5.5.11 කම්කරු දෙපාර්තමේන්තුවේ හා අමාත්‍යාංශයේ ඉංජිනේරුමය කටයුතු ඉටු කිරීම

1.5.6 වෘත්තීය ස්වස්ථතා අංශය

බලපවත්නා කර්මාන්ත ශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂාවන පරිදි සේවා ස්ථානයේ පරිසරය සැකසීම සේවායෝජකයාගේ අනිවාර්ය වගකීමක් වන අතර, ආරක්ෂිත සේවා පරිසරයක සේවය කිරීමට ඇති හිමිකම සේවකයන්ගේ මූලික අයිතිවාසිකමක් වේ.

වෘත්තියෙහි නිරතවීමේදී සේවා පරිසරයේ දුර්වලතා මත ශ්‍රමිකයන් රෝග තත්ත්වයනට ගොදුරුවීමේ අවධානම හා හදිසි අනතුරුවලට ගොදුරු වීම අවම කිරීම මගින් වෘත්තිකයන්ට ලබා දිය හැකි ඉහළම කායික, මානසික, සමාජීය හා ආධ්‍යාත්මික සුභ සාධනය සහිත පරිසරයක් සේවා පියස තුල ඇති කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන දැනුම ලබා දීම හා සේවා පියස තුල ඇති තත්ත්ව පරීක්ෂාවට ලක් කිරීම **වෘත්තීය ස්වස්ථතා අංශයේ** මෙහෙයුම් ක්‍රියාවලියවේ.

මූලික වශයෙන්ම සේවා පරිසරයේ යම් දුර්වලතා මත ක්ෂණිකව හෝ දීර්ඝ කාලීන වශයෙන් ශ්‍රමිකයන් සෞඛ්‍ය ගැටළුවලට මුහුණදීමට සිදුවියහැකි තත්ත්වයන් පවතින්නේද යන්න විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ සොයාබැලීම, එමගින් ඇතිවියහැකි සෞඛ්‍ය ගැටලු ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රමාණනය කිරීම පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් යටතේ සිදුකිරීම, එම අනතුරු වැළැක්වීම සඳහා පියවර ගැනීම හා වලක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම ප්‍රායෝගිකව සිදුකරනු ලැබේ.

මූලික වශයෙන් වෘත්තීය ස්වස්ථතා අංශය විසින් පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

1.5.6.1 සේවා ස්ථාන වල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම

1.5.6.2 සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව ආරක්ෂා කිරීමට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම

1.5.6.3 වෛද්‍ය මණ්ඩල තීරණ ලබා දීම

1.5.6.4 වෘත්තීය ස්වස්ථතා කරුණු මත වන්දි ඉල්ලුම් කරන අය පිළිබඳ, රෝගී තත්ත්වය ඇති වීම හා සේවා ස්ථානයේ තත්ත්වයන් පිළිබඳව අධිකරණයේදී සාක්ෂි ලබා දීම

1.5.6.5 සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙතින් අරමුදල් අයදුම්කරන, සේවය කිරීමට නොහැකිවන පරිදි රෝගී තත්ත්වයනට පත්වූ සේවකයන්ගේ රෝග තත්ත්ව තක්සේරු කිරීම

1.5.7 කාන්තා හා ළමා කටයුතු අංශය

ශ්‍රී ලාංකීය ශ්‍රම බලකාය තුල කාන්තා දායකත්වය ඉහළ නැංවීම හා ළමා ශ්‍රමය මුළුමනින් තුරන් කිරීම ශ්‍රී ලංකා රජයේ අත්‍යවශ්‍ය වගකීමක්ව පවතින අතර මෙම වගකීම කාන්තා හා ළමා කටයුතු අංශයේ කාර්යයන්හි මූලික දෙවැදෑරුම් වගකීම බවට පත්ව තිබේ.

ඒ අනුව, වැඩ බිමෙහි කාන්තාවන් ආවරණය වන කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මගින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම මෙම අංශයේ එක් ප්‍රමුඛ වගකීමක් වේ.

එසේම, සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය සහිතව ළමා ශ්‍රමය තුරන් කිරීම, වයස අවුරුදු 18ට අඩු පුද්ගලයන් සඳහාවන කම්කරු නීති ක්‍රියාත්මක කිරීම, පවත්නා නීතිය සංශෝධනය කොට වර්තමාන සමාජ ගැටළු වලට අදාළව, පවත්නා නීතියෙහි කළයුතු සංශෝධනයන් නිර්දේශ කිරීම මෙම අංශයේ ප්‍රමුඛ වගකීම වේ.

ඒ අනුව, අංශය විසින් පහත කාර්යයන් ඉටු කරනු ලබයි

1.5.7.1 රැකියාවන්හි නිරත කාන්තාවන් හා තරුණ අය කෙරෙහි අදාළ වන්නාවූ පනත්හි විධිවිධාන ක්‍රියාවට නැගීම හා ඒ සඳහා කලාප හා දිස්ත්‍රික් කම්කරු කාර්යාල මෙහෙයවීම

1.5.7.2 කාන්තාවන් හා ළමුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දීප ව්‍යාප්තව සිදු කිරීම

1.5.7.3 රැකියාවන්හි නියුතු කාන්තාවන්ට හා ළමුන්ට අදාළව පවත්නා නීතිය අධ්‍යයනය කොට දුර්වලතා හා ඌනතා හඳුනාගෙන නීතිය ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම

1.5.7.4 ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය යන මට්ටම් වලින් පවත්වනු ලබන ළමා සංවර්ධන කමිටු වලදී සළුල දායකත්වයක් ලබා දීම

1.5.7.5 රැකියාවල නියුතු කාන්තාවන් සඳහා නිදහස් වෙළඳ කලාපයන්හි පිහිටුවා ඇති කම්කරු දෙපාර්තමේන්තුවට අයත් කාන්තා නේවාසිකාගාර නඩත්තු කිරීම

එසේම, මෙම අංශය මගින් පහත නෛතික විධිවිධාන බලාත්මක කෙරනු ලැබේ.

- 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත
- 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥා පනත

1.5.8 සේවක අර්ථසාධක අරමුදල් අංශය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදෙන ශ්‍රමිකයන්හට යහපත් ආර්ථික තත්ත්වයක් සහිත විශ්‍රාම දිවියක් උරුමකරදීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර,

එහි අරමුදල් කළමනාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. වරින් වර සංශෝධනය වූ මෙම පනත යටතේ මේ වන විට ඉටුකරනු ලබන කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

1.5.8.1 සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවායෝජකයින් ලියාපදිංචි කිරීම
1.5.8.2 සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම
1.5.8.3 දායක මුදල් නොගෙවන සේවා දායකයන්ගෙන් දායක මුදල් අයකර ගැනීම
1.5.8.4 සාමාජිකයන් වෙත ප්‍රතිලාභ මුදල් ගෙවීම් සිදුකිරීම සඳහා ගෙවීම් නියෝග ලබාදීම
1.5.8.5 අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

1.5.9 නීති ක්‍රියා අංශය

කම්කරු නීති දිවයින පුරා වඩාත් ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීම තුලින් කාර්මික සාමය තහවුරු කිරීමේ දැක්මෙන් යුතුව කම්කරු දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියා අංශය ක්‍රියාත්මක වේ. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවිය යුතු අණ පනත්හි ප්‍රතිපාදන දිවයින පුරා ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා එම නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේවය සේවක අයිතීන් සුරක්ෂිත කරමින් සේවය සේවක සහයෝගීතාවය වර්ධනය කිරීමත් දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියා අංශය විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව, නීති ක්‍රියා අංශයේ මූලික කාර්යයන් පහත පරිදි දැක්විය හැකිය.

1.5.9.1 ව්‍යවස්ථාපිත කම්කරු නීති උල්ලංඝනයවීමකදී ඊට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට අදාළ කාර්යයන් ඉටු කිරීම හා එම නඩු මෙහෙයවීම

1.5.9.2 වාණිජ මහාධිකරණයේ, පළාත්බද මහාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ කම්කරු දෙපාර්තමේන්තුවට එරෙහිව හෝ දෙපාර්තමේන්තුව විසින් පවරනු ලබන නඩු වලදී එම නඩු පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව සමග අවශ්‍ය සම්බන්ධීකරණය පවත්වා ගැනීම

1.5.9.3 කලාප කාර්යාල අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මගින් සිදු කරනු ලබන අධිකරණමය ක්‍රියාවන් අධීක්ෂණය කිරීම, අවශ්‍ය උපදෙස් ලබා දීම හා එම අධිකරණමය ක්‍රියාවන්හි ප්‍රගතිය පරීක්ෂා කිරීම

1.5.9.4 කලාපය තුල පවත්නා දිස්ත්‍රික් / උප කම්කරු කාර්යාලවල හා අධිකරණ ක්‍රියාමාර්ග වලට යොමු විය යුතු අවස්ථාවලදී හා අක්‍රීය නඩු සක්‍රීය කිරීමේ ක්‍රියාවලියේදී අවශ්‍ය උපදෙස් ලබා දීම සහ අවශ්‍ය අවස්ථාවලදී දෙපාර්තමේන්තුව වෙනුවෙන් නඩු මෙහෙයවීම කලාප කාර්යාලවල සේවයේ නියුතු නීති නිලධාරීන් විසින් ඉටු කරනු ලැබේ.

1.5.10 පාලන අංශය

පාලන අංශය ශාඛා 04කින් සමන්විත වේ. එනම්, පාලන ශාඛාව, ආයතන ශාඛාව, ගොඩනැගිලි නඩත්තු ඒකකය සහ පුස්තකාලය වේ.

ඒ අතුරින් පාලන ශාඛාව මගින් දෙපාර්තමේන්තුවේ සියලුම සේවා සහ සැපයීම් පිළිබඳව කටයුතු කරනු ලබයි. ඒ යටතේ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදි කිරීමට අදාළව ඉඩම් අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඉඩම් අත්පත් කර ගැනීම, ගොඩනැගිලි ඉදි කිරීමේ කටයුතු මෙහෙයවීම, ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමට අදාළ කටයුතු මෙහෙයවීම, අවශ්‍යතාවය පරිදි ගොඩනැගිලි කුලියට ලබා ගැනීම, දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය, දෙපාර්තමේන්තුවේ අංශ සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, ප්‍රාග්ධන භාණ්ඩ හා උපකරණ කළමනාකරණය, අතිකාල, නිවාඩු දින වැටුප්, අග්‍රහාර රක්ෂණ සහ ආපදා ණය අනුමත කිරීම ආදී කටයුතු සිදු කරනු ලබයි.

ආයතන ශාඛාව මගින් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම, අවශ්‍යතාවය පරිදි බඳවා ගැනීම් සම්බන්ධ සියලු කටයතු, නිලධාරීන්ගේ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම්, කාර්ය සාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, නිලධාරීන් විශ්‍රාම ගැන්වීම, නිලධාරීන්ගේ නිවාඩු කටයුතු සහ කාර්ය මණ්ඩලයේ විනය කටයුතු යන විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

ගොඩනැගිලි නඩත්තු ඒකකය මගින් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදි කිරීමට සහ ගොඩනැගිලි පුනරුත්ථාපනයට හා වැඩි දියුණු කිරීමට අදාළ කටයුතු සම්බන්ධයෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තු සහ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම සඳහා සහය වීම, ගොඩනැගිලි ඉදි කිරීම සම්බන්ධයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයතු සිදු කිරීම,ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමට අදාළ කටයුතු අධීක්ෂණය මෙන්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල සියලුම නඩත්තු කටයුතු සම්බන්ධයෙන්ද කටයතු කරනු ලබයි.

කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත්, පොත්පත් හා ප්‍රකාශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම පුස්තකාලය වේ. මෙමගින් කම්කරු දෙපාර්තමේන්තුවේ, කම්කරු අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල සඳහා මෙන්ම බාහිර පාඨකයන් සඳහාද කම්කරු නීති ක්ෂේත්‍රයට අදාළ සියලුම අන පනත්, පොත් පත්, ප්‍රකාශන ආදිය පරිශීලනය සඳහා පහසුකම් සලසනු ලබයි.

කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය තුළ පොත්පත්, ප්‍රකාශන හා සඟරා 200,000කට අධික සංඛ්‍යාවක් තැන්පත් කර ඇත. ඒ යටතේ කම්කරු නීති සම්බන්ධ අන පනත්, පොත් පත්, සඟරා, වාර

ප්‍රකාශන, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රකාශන, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රකාශන, ළමා ශ්‍රමය සම්බන්ධ ප්‍රකාශන ආදී වශයෙන් මෙම එකතුව වර්ගීකරණය කළ හැකි වේ.

1.5.11 මුදල් අංශය

කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරකම් සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා සහ අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම සඳහා භෞතික සම්පත් මෙන්ම මූල්‍ය සම්පත්ද අත්‍යවශ්‍ය සාධකයකි. ඒ අනුව, වාර්ෂික අයවැය මගින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලබන මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, කාර්යක්ෂමව, ඵලදායීව හා පිරිමැසුම්දායීව පරිපාලනය කිරීම මුදල් අංශය විසින් සිදු කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ මූල්‍ය පරිපාලනය කාර්යක්ෂමව සහ විනිවිදභාවයෙන් සිදු කිරීම උදෙසා මුදල් අංශය පහත පරිදි ක්‍රියාත්මක වේ.

1.5.11.1 දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන සැලැස්ම සැකසීම හා එය ක්‍රියාත්මක කිරීම.
1.5.11.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබා ගන්නා ලද භාණ්ඩ හා සේවා නිසි පරිදි බෙදාහැරීම.
1.5.11.3 ප්‍රාදේශීය කාර්යාල සඳහා අග්‍රිම නිකුත් කිරීම හා එම කාර්යාලවල මූල්‍ය අධීක්ෂණය.
1.5.11.4 මාසික අර්ධ වාර්ෂික හා වාර්ෂික ගිණුම් වාර්තා සැකසීම හා අදාළ පාර්ශවයන් වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම.
1.5.11.5 බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන සියලුම ලැබීම් හා ගෙවීම් කටයුතු නීතිරීති ප්‍රකාරව මෙහෙයවීම.
1.5.11.6 දෙපාර්තමේන්තුව සතු ප්‍රාග්ධන වත්කම් සමීක්ෂණය හා අපහරණ කටයුතු.
1.5.11.7 දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ වැටුප්, ණය අත්තිකාරම් හා දීමනා ගෙවීම.

1.5.12 සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම හා උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම සහ ඒ යටතේ වන ඉලක්කයන්ට අදාළව දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන් හා ප්‍රාදේශීය කාර්යාල මෙහෙයවීමේ කටයුතු සම්බන්ධීකරණය, දෙපාර්තමේන්තුවේ අංශයන්හි ප්‍රගතිය සහ ඉදිරි කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පවත්වනු ලබන කම්කරු කොමසාරිස්වරුන්ගේ මාසික රැස්වීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම, කම්කරු අමාත්‍යාංශය විසින් ප්‍රගති සමාලෝචනය සඳහා මාසිකව පවත්වනු ලබන කළමනාකරණ මෙහෙයුම් කමිටු රැස්වීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය සකස් කිරීම සහ එම රැස්වීමේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, කම්කරු අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉල්ලුම් කරනු ලබන දත්ත හා වාර්තා සැපයීම **සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශයේ** සැලසුම් හා ප්‍රගති සමාලෝචන කාර්ය භාරය වේ.

කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයන්හි ප්‍රගති සමාලෝචන කටයුතු මෙහෙයවීමේ වගකීම මෙම අංශය මගින් දරනු ලබයි. ඒ යටතේ, ප්‍රාදේශීය කාර්යාලයන්හි වාර්ෂික ප්‍රගති

සමාලෝචන සැලැස්ම සකස් කිරීම හා අධීක්ෂණය මෙම අංශය විසින් සිදු කරනු ලබයි. එහිදී කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් මගින් එක් එක් කලාපයන්හි ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම මෙන්ම අංශය මගින් අධීක්ෂණ කණ්ඩායම් යොමු කර එක් එක් කාර්යාලයන්හි ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරීමද සිදු කරනු ලබයි.

ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර ඉටු කර ගැනීම සඳහා සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මෙන්ම දෙපාර්තමේන්තුවේ සියලු අංශ ක්‍රියාත්මක වන ආකාරය සහ අදාළ වාර්ෂික ඉලක්ක කරා යොමු වීම අධීක්ෂණයද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ. එහිදී, දෙපාර්තමේන්තුවේ අංශ හා දිස්ත්‍රික් කාර්යාල වල කාර්යයන් අධීක්ෂණය හා එමගින් ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කර කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා අදාළ කාර්යාලයන්හි ප්‍රගතිය තව දුරටත් වර්ධනය කර ගැනීම පිණිස අවශ්‍ය නිර්දේශ ලබා දීම මෙම අංශයේ අධීක්ෂණ කාර්යය වශයෙන් ඉටු කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වන පුහුණුව ලබා දීම බාහිර ආයතන විසින් පවත්වන පුහුණු පාඨමාලා වෙත නිලධාරීන් යොමු කිරීම, විශ්ව විද්‍යාල උපාධි හා පශ්චාත් උපාධි සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සහ විදේශ පුහුණු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කාර්යය ඉටු කිරීම මෙම අංශය විසින් ඉටු කරනු ලබන මානව සම්පත් සංවර්ධනය පිළිබඳ කාර්යභාරය වේ.

එසේම, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අවශ්‍ය කම්කරු නීති සම්බන්ධ අණ පනත් සහ පඩි පාලක සභා තීරණ මුද්‍රණය කර ලබා දීම, කම්කරු නිලධාරීන්ට ක්ෂේත්‍ර කටයුතු සඳහා උපයෝගී කර ගැනීම පිණිස අවශ්‍ය වන ශ්‍රමික පරීක්ෂණ වාර්තා, මාසික දින පොත් ආදී පොදු ආකෘති පත්‍ර මුද්‍රණය කර ලබා දීම ආදී මුද්‍රණ කටයුතුද මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

1.5.13 සංඛ්‍යාලේඛන අංශය

ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ දිශානතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, පවතින කම්කරු නීති සහ අණපනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම හා ක්ෂේත්‍රය පිළිබඳව අනාගත පුරෝකථනය සඳහා කම්කරු ක්ෂේත්‍රයට අදාළව දත්ත එක් රැස් කර විශ්ලේෂණය කිරීම සංඛ්‍යාලේඛන අංශයේ කාර්යභාරය වේ. මෙම අංශය සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශයේ කම්කරු කොමසාරිස්ගේ අධීක්ෂනය යටතේ ක්‍රියාත්මක වේ.

1.5.14 අභ්‍යන්තර විගණන අංශය

අනෙකුත් සියලුම රාජ්‍ය ආයතන මෙන්ම කම්කරු දෙපාර්තමේන්තුව විසින්ද සිය සියලු ක්‍රියාකාරකම් මුදල් රෙගුලාසි, රජය විසින් කලින් කලට නිකුත් කරන ලද චක්‍රලේඛ සහ දෙපාර්තමේන්තුව විසින්ම නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව විධිමත් පරිදි සිදු කළ යුතු වේ. ඒ අනුව, එම කටයුතු සම්පත්වල

ඉහල උපයෝගිතාවයක් සහිතව මනා විනිවිදභාවයකින් සහ ප්‍රශස්ත මට්ටමින් සිදුවේද යන්න අධීක්ෂණය සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා ඇත.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ ශ්‍රමිකයන්හට යහපත් ආර්ථික තත්ත්වයක් සහිත විශ්‍රාම දිවියක් උරුම කරදීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.
මෙම අරමුදල පිළිබඳ වැඩිදුර විස්තර ඉහත 01 පරිච්ඡේදයෙහි 1.5.8 යටතෙහි සහ 02 පරිච්ඡේදයෙහි සඳහන් කර ඇත.

දෙවන පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා කාර්මික සාමය සුරක්ෂිත කිරීම

2.1.1. සේවා සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම

පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේවා සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා එම අංශයේ ආයතනවල සේවා සේවක දෙපාර්ශවයම කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් මෙන්ම රාජකාරි කටයුතු සිදු කිරීමේදී කම්කරු නීති පිළිබඳව දැනුවත්භාවක් ලැබිය යුතු අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්ද දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කොට පවත්වන ලදී.

වගුව 2.1 – 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

වැඩසටහනෙහි ස්වභාවය	වැඩසටහනෙහි නම	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව
සමාජ කතිකාව ප්‍රවර්ධනය	මානව සම්පත් සංවර්ධන අංශය විසින් පැවැත්වූ සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන්	167	9489
	දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල විසින් පැවැත්වූ සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන්	51	1904
	කලාප සමාජ වේදිකා වැඩසටහන් (Zoom තාක්ෂණය මගින්)	11	1100 (දළ වශයෙන්)
කර්මාන්තමය සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය	දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල මගින් ප්‍රාදේශීයව පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ දේශන	107	4370
වෘත්තීය සෞඛ්‍යය ප්‍රවර්ධනය	වෘත්තීය ස්වස්ථතා අංශය විසින් පැවැත්වූ සේවායන් සහ සේවකයන් සඳහා වූ අධ්‍යාපනික, පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්	289	2380
ස්ත්‍රීන් සහ තරුණ අයගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ළමා ශ්‍රමය පිටු දැකීම	පෞද්ගලික අංශයේ කාන්තා සේවිකාවන්සඳහා කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්	16	716
	ළමා ශ්‍රමය සම්බන්ධව පරිවාස නිලධාරීන්, කම්කරු නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සම්බන්ධීකරණය කිරීමේ වැඩසටහන	04	180
	ළමා ශ්‍රමය සම්බන්ධව දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ළමා සංවර්ධන නිලධාරීන්, ළමා සමාජ වල නිලධාරීන්, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, පාසල් ළමා ආරක්ෂක කමිටු නිලධාරීන්, තරුණ සේවා, ප්‍රජා සංවර්ධන නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	52	2600
එකතුව		**697**	**21,639**

2.1.2 පරීක්ෂණ සිදු කිරීම

සේවා ස්ථානයන්හිදී සේවකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් ආරක්ෂා කිරීම සඳහා පනවා ඇති නීති හා රෙගුලාසි නිසි පරිදි ක්‍රියාත්මක වේද යන්න පරීක්ෂාවට ලක් කර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සේවා සේවක දෙපාර්ශවය අතර ගැටළු ඇති වීම පාලනය කර සුහද සම්බන්ධතාවයක් ඇති කිරීම උදෙසා 2022 වර්ෂය තුළ සිදු කළ පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

රූප සටහන 2.1 - පරීක්ෂණ සිදු කිරීම් - 2022 වර්ෂයේ ප්‍රගතිය




දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි කම්කරු නිලධාරීන් විසින් පරීක්ෂණ සිදු කිරීමෙන් අනතුරුව ලබා දෙන කම්කරු පරීක්ෂණ වාර්තාවන් මගින් ලබා දෙන තොරතුරු වඩාත් සවිස්තරාත්මකව ලබා ගැනීම සහ ඒවායේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ අරමුණින් ඒකාබද්ධ ශ්‍රමික පරීක්ෂණ වාර්තාව සංශෝධනයට අවශ්‍ය කටයුතුද 2022 වර්ෂයේදී සිදු කරන ලදී. මෙම වාර්තාව 2023 වර්ෂයේ සිට පරීක්ෂණ කටයුතු සඳහා භාවිතා කිරීමට අපේක්ෂිතය.


2.1.3 ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වෙත සහ දිස්ත්‍රික් හා උපකාර්යාල වෙත සේවකයන් හෝ වෘත්තීය සමිති විසින් සිදු කරනු ලැබූ ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳව සහ කාර්මික ආරාවුල් සම්බන්ධයෙන් ලද පැමිණිලි විසඳීමට කටයුතු කරන ලදී. එසේම, දෙපාර්තමේන්තුවේ අංශයක් හෝ කම්කරු කාර්යාලයක් විසින් සිදු කරන ලද පැමිණිලි විමර්ශනයක් හෝ ආයතන පරීක්ෂණයක් සම්බන්ධයෙන් සෑහීමට පත්නොවන අයකු විසින් විධිමත් පරීක්ෂණයක් ලබාගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත කරනු ලබන ඉල්ලීම් අවශ්‍යතාවය පරිදි නැවත විමර්ශනය කිරීමද සිදු කරන ලදී.

ප්‍රස්ථාරය 2.1 - 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා නිරවුල් කිරීම්



ප්‍රස්ථාරය 2.2 - 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා නිරවුල් කිරීම්



ඉහත ප්‍රස්තාර අනුව කාර්මික ආරවුල් සහ ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීමේ අඩුවන ප්‍රවණතාවයක් පෙන්නුම් කෙරේ. සියලු කාර්යාලයන් සහ අංශයන් විසින් පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය ක්‍රමානුකූල කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට ලැබෙන පැමිණිලි / පෙත්සම් විසඳීම

සඳහා සම්මත කාර්ය පරිපාටියක් (**Standard Operating Procedure (SOP) in settlement / resolution of labour complaints / disputes**) සකස් කරන ලදී. 2021 නොවැම්බර් මස සිට සියලු කම්කරු කාර්යාලයන් විසින් මෙම පරිපාටිය භාවිතා කරමින් පැමිණිලි කඩිනමින් විසඳීමට කටයුතු කරනු ලැබේ.

2.1.4 වැඩ වර්ජනවලිදී අදාළ මැදිහත්වීම් සිදු කිරීම

කාර්මික ආරවුලක් වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ වහාම දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් එම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කරන අතර, වැඩ වර්ජනයක් ඇති වුවහොත් ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කර විසඳීමට කටයුතු කරනු ලැබේ. 2022 වර්ෂය තුල වාර්තා වූ වැඩ වර්ජන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

රූප සටහන 2.2 - වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2022



2.1.5 සාමූහික ගිවිසුම් සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවය පෙළඹවීම

කාර්මික ආරාවුල් නිරවුල් කිරීමේදී සාමූහික ගිවිසුම් වලට එලඹීම මගින් සේව්‍ය සේවක දෙපාර්ශවය වෙත වඩා ස්ථිර විසඳුමක් ලැබීම මෙන්ම කම්කරු නීති රීතිවලින් ලබාදී ඇති අයිතිවාසිකම් වලට වඩා වැඩි වරප්‍රසාද ලබා ගැනීමට හැකියාවද ලැබේ. එබැවින්, සාමූහික ගිවිසුම් සඳහා සමාජ කතිකාවත තුළින් පෙළඹවීමක් සිදුකිරීමට දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් උත්සාහ ගනු ලැබේ. ඒ අනුව, 2022 වර්ෂය තුලදී ගැසට් පත්‍රයේ පළ කරන ලද සාමූහික ගිවිසුම් 23ද ඇතුළුව 2022.12.31 දිනට ක්‍රියාත්මකව පවතින සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 194කි.

2.1.6 බේරුම්කරණ කටයුතු සිදු කිරීම

ප්‍රාදේශීය කාර්යාල මගින් හෝ ප්‍රධාන කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශය මගින් කටයුතු කළ ද නිරවුල් කළ නොහැකි වූකාර්මික ආරාවුල්, අනිවාර්ය බේරුම්කරණය වෙත හෝ කාර්මික අධිකරණය වෙත යොමු කිරීම සිදු කරනු ලැබේ. 2022 වර්ෂය තුළදී බේරුම්කරණයට යොමු කරන ලද ආරවුල් 93ද ඇතුලත්ව ආරවුල් 306ක් සම්බන්ධයෙන් 2022 වර්ෂය තුලදී කටයුතු කිරීමට තිබුණි. එයින් ආරවුල් 129ක විමර්ෂණ කටයුතු මෙම වර්ෂය තුළදී අවසන් කර ප්‍රදාන ලබාදීම් 93ක්ද සිදු කරන ලද අතර ඉතිරි 36 සඳහා ඉදිරි වර්ෂයේදී ප්‍රදාන ලබා දීමට ඇත. ඒ අනුව, 2022.12.31 දින වන විට ඉතිරි ආරවුල් 177 සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පැවතිණි.

2.1.7 වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම

සෑම වෘත්තීය සමිතියක්ම කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි වීම අනිවාර්ය කටයුත්තකි. ඒ අනුව, 2022 වර්ෂය තුලදී දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති සංඛ්‍යාව 143කි. 2022.12.31 දිනට වලංගු මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 2053කි. වර්ෂය තුළදී වෘත්තීය සමිති 28ක් අවලංගු කර ඇත.

2.2 ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුභසාධනය කෙරෙහි බලපාන්නා වූ වැටුප්, සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා ඒවාට නෛතික තත්ත්වය ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරයක් වේ. ඒ අනුව, 2022 වර්ෂය තුලදී පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.


2.2.1 පඩිපාලක සභාවල අවම වැටුප් යාවත් කාලීන කිරීම

වගුව 2.2 - පඩිපාලක සභාවල අවම වැටුප් යාවත් කාලීන කිරීම - 2022


අ.අ.	පඩිපාලක සභාව	පළමු රැස්වීම පවත්වා ඇත	විරෝධතා කැඳවා ඇත	වැටුප් සංශෝධනය කර ඇත
01.	ගොඩනැගිලි කර්මාන්තය.		✓	
02.	බේකරි කර්මාන්තය.			✓
03.	ගුදුරි කොහු හා ඇට කෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය.			✓
04.	ඇඳුම් සෑදීමේ කර්මාන්තය.		✓	
05.	හෝසියරි (මේස් භාණ්ඩ) සෑදීමේ කර්මාන්තය.	✓		
06.	පිහන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය.		✓	
07.	ගල් කොරි හා කළුගල් කැඩීමේ කර්මාන්තය.		✓	
08.	කුරුදු කර්මාන්තය.		✓	
09.	මෝටර් රථ ගමනාගමන කර්මාන්තය.		✓	
10.	සිනමා කර්මාන්තය.		✓	
11.	නාවික ප්‍රවාහන හා මෙහෙයුම් සේවා කර්මාන්තය			✓
12.	බතික් කර්මාන්තය.			✓
13.	පෙර පාසල් සේවා කර්මාන්තය.			✓
14.	බීඩී සෑදීමේ කර්මාන්තය.			✓
15.	මල් විසිතුරු පැල එළවළු හා පළතුරු වගා කිරීමේ හා පිටරට යැවීමේ කර්මාන්තය.			✓

සටහන - වැටුප් සංශෝධනය කර ඇති පඩිපාලක සභාවන්හි සංශෝධිත වැටුප් ගැසට් පත්‍රයේ පළ කිරීමේ කටයුතු සහ පළමු රැස්වීම පවත්වා ඇති සහ විරෝධතා කැඳවා ඇති පඩිපාලක සභාවන්හි ඉදිරි කටයුතු සිදු කිරීමට ඇත.


2.2.2 දින 05 වැඩ සතිය සඳහා අනුමැතිය ලබා දීම




2.2.3 සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම්




2.2.4 පඩි පාලක සභා අඥාපනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම



2.2.5 පඩි පාලක සභා ආඥා පනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ දඩ අරමුදල් පිහිටුවීම සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම



2.2.6 අණ පනත් පිලිබඳව මහජනතාව හා විවිධ ආයතන මගින් කරනු ලබන විමසීම් වලට පැහැදිලි කිරීම් හා අර්ථනිරූපණ ඉදිරිපත් කිරීම



2.3 සේවකයාගේ වෘත්තීය සුරක්ෂිතතාවය සඳහා වූ සුනිසි වැඩ පරිසරය තහවුරු කිරීම

කර්මාන්තශාලා තුල සේවයෙහි යෙදෙන ශ්‍රමිකයන් හට භෞතිකමය වශයෙන් යම් ශාරීරික හානි සිදුවීම්, විදුලිය, තාපය, වායු පීඩනය, අධික ආලෝකය හා ශබ්දය මගින් ශාරීරික හානි හෝ මරණය පවා සිදුවීමේ අවදානමක් පවතී. එබැවින්, අනතුරු ඇති වීම අවම කිරීම දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ. ශ්‍රී ලංකාවේ කර්මාන්තශාලාවල සේවය කරන සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුභසාධනයට අදාළ ප්‍රධානම නීතිමය ප්‍රතිපාදනයක් වනුයේ වර්ෂ 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත හා ඒ යටතේ පනවා ඇති රෙගුලාසින්ය.


අනතුරු රහිත වැඩ පරිසරය තහවුරුකිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන වශයෙන් පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

රූප සටහන 2. 3 - 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ ඉටු කළ ක්‍රියාකාරකම්	
	**2022 වර්ෂය තුල නව රෙගුලාසි අනුව ලියාපදිංචි කරන ලද කර්මාන්තශාලා සංඛ්‍යාව = 1261** **2022.12.31 දිනට නව රෙගුලාසි අනුව ලියාපදිංචි වී ඇති මුළු කර්මාන්තශාලා සංඛ්‍යාව = 3222** **(2022 වර්ෂය තුල වර්ෂය තුල අළුතින් ආරම්භ කරන ලද කර්මාන්තශාලා ගොනු සංඛ්‍යාව 881ක් වන අතර ඒ අනුව, 2022.12.31 දිනට පවත්වාගෙන යනු ලබන මුළු කර්මාන්තශාලා ගොනු සංඛ්‍යාව 33,056 කි)**
	**පරීක්ෂා කර අනුමත කළ ගොඩනැගිලි පිඹුරුපත් සංඛ්‍යාව =275**
	**පරීක්ෂා කළ කර්මාන්තශාලා සංඛ්‍යාව =3274**
	**වාර්තා වී ඇති මරණීය අනතුරු සංඛ්‍යාව = 66** **වාර්තා වී ඇති මරණීය නොවන අනතුරු සංඛ්‍යාව = 1260**
	**අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂාව නියාමනය** ***කිරීම් සංඛ්‍යාව = 11,669***

2.4 සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම්

සේවා ස්ථානයන්හි සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සේවා ස්ථානවල සෞඛ්‍ය ගැටලු හෝ අනතුරු සිදුවීමට හැකි අවස්ථා තිබෙද යන්න විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ සොයා බැලීම සහ එම අනතුරු වැළැක්වීම සඳහා පියවර ගැනීම හා වලක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම දෙපාර්තමේන්තුව සතු වගකීමකි. ඒ අනුව 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

රූප සටහන 2.4 - 2022.01.01 සිට 2022.12.31 දක්වා කාලය තුළ ඉටු කළ ක්‍රියාකාරකම්




2.5 සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම

කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මගින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම දෙපාර්තමේන්තුවේ එක් ප්‍රමුඛ වගකීමක් වේ.


එසේම, සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය තුළින් ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමය තුරන් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යයක් ඉටු කිරීමට කටයුතු කිරීම මෙන්ම, වයස අවුරුදු 18 ට අඩු ළමුන් සඳහාවන කම්කරු නීති ක්‍රියාත්මක කිරීමත්, ස්ත්‍රීන් තරුණ අය සහ ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ නීති රීති කාලීනව සංශෝධනය කිරීම සඳහා නිර්දේශයන් ඉදිරිපත් කරමින් ඒවා ක්‍රියාත්මක කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

ඒ අනුව, 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.


2.5.1 ළමා ශ්‍රමය පිළිබඳ ලද පැමිණිලි සඳහා පරීක්ෂණ සිදු කිරීම



2.5.2 කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ පරීක්ෂණ



2.5.3 කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම



2.5.4 ගම්පහ, කළුතර, බදුල්ල සහගාල්ල යන දිස්ත්‍රික්ක 'ළමා ශ්‍රමයෙන් තොර කලාප' ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා එම දිස්ත්‍රික්කයන්ට අදාළව දිස්ත්‍රික් කමිටු පත් කිරීම සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම.

2022 වර්ෂය තුළදී, ගාල්ල, බදුල්ල සහ ගම්පහ දිස්ත්‍රික්ක සඳහාවන දිස්ත්‍රික් කමිටු රැස්වීම් පවත්වා ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහාවන මූලික සාකච්ඡා සිදුකරන ලදී. ඉන් අනතුරුව ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා එම දිස්ත්‍රික්ක තුළ වයස් අවුරුදු 18ට අඩු දරුවන් පිළිබඳ තොරතුරු රැස්කිරීමේ කටයුතු සිදු කිරීම 2 වන පියවර වශයෙන් ක්‍රියාත්මක කරන ලදී. එසේම, ගාල්ල, බදුල්ල සහ ගම්පහ දිස්ත්‍රික්ක සඳහා ළමා සංවර්ධන සැලැසුම් සකස් කර අවසන් කර ඇත. ඒ අනුව සෘජු පාර්ශවකරුවන් පුහුණු කිරීම සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 න් 17ක ද බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15හි ම ද ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13න් 03ක ද වැඩමුළු පවත්වන ලදී. කළුතර දිස්ත්‍රික්කය සඳහා මූලික සාකච්ඡාව පවත්වා ඇති අතර එහි ඉදිරි කටයුතු සිදු කළ යුතු වේ.

2.5.5 ළමා ශ්‍රමයට ලක් වූ සහ ළමා ශ්‍රමයට අවදානමක් සහිත දරුවන් සිටින පවුල්වල දරුවන්ගේ අනාගත සුරක්ෂිතභාවය වර්ධනය කිරීම

මැලිබන් බිස්කට් මැනුෆැක්චරිස් පුද්ගලික සමාගම සමඟ දෙපාර්තමේන්තුව විසින් අත්සන් කළ අවබෝධතා ගිවිසුමට අනුව ළමුන් රැකියාවන්හි නිරතකර තිබූ සහ ඒ සඳහා අවදානමක් සහිත දරුවන් සිටින පවුල් 50ක් තෝරාගනිමින් එම පවුල් වල දරුවන්ගේ අනාගත සුරක්ෂිතභාවය ඇති කිරීම උදෙසා එම පවුල් වල ආර්ථිකය නඟා සිටුවීමට " නිදහසේ රන් දරුවෝ අරමුදල" හරහා අවශ්‍ය උපකරණ සහ මූල්‍යමය සහය ලබා දීමේ ව්‍යාපෘතියේ මූලික පියවරක් ලෙස ආර්ථික අපහසුතා පවතින දරුවන් සිටින තෝරාගත් පවුල් සඳහා අවශ්‍ය ප්‍රතිලාභ ලබා දීමට පහත පරිදි කටයුතු කරන ලදී.

වගුව 2.3 - " නිදහසේ රන් දරුවෝ අරමුදල" මඟින් ප්‍රතිලාභ ලබා දීමේ ප්‍රගතිය - 2022

වැඩසටහන	වැඩසටහන ක්‍රියාත්මක කරන ලද දිස්ත්‍රික්කය	ප්‍රතිලාභ ලබා දුන් පවුල් සංඛ්‍යාව
පළමු	මාතර	පවුල් 4
දෙවන	අනුරාධපුර	පවුල් 6
	පොළොන්නරුව	
තෙවන	කොළඹ	පවුල් 4
සිව්වන	කුරුණෑගල	පවුල් 5
පස්වන	රත්නපුර	පවුල් 2



ඡායාරූපය 2.1 - " නිදහසේ රන් දරුවෝ අරමුදල" මඟින් ප්‍රතිලාභ ලබා දීමේ අවස්ථාවක්

ඒ අනුව 2022 වර්ෂය ඇතුළත ආර්ථික අපහසුතා සහිත සහ ළමා ශ්‍රමයට යෙදවූ සහ අවදානම් සහිත පාසල් වයසේ දරුවන්ගේ පවුල් 21 ක් සඳහා ප්‍රතිලාභ ලබා දී ඇති අතර මාසිකව රු.7500.00 බැගින් අවුරුද්දක කාලයක් දරුවන් 21 දෙනකු සඳහා ශිෂ්‍යත්ව ද ලබා දී ඇත. එමඟින් දරුවන් 21 දෙනකුගේ අධ්‍යාපනය ද සුරක්ෂිත කර ඇත.

2.6 සේවකයන්ගේ සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදෙන සේවකයන් සඳහා සුරක්ෂිත විශ්‍රාම දිවියක් උරුම කරදීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දරනු ලැබේ. වරින් වර සංශෝධනය වූ මෙම පනත යටතේ දෙපාර්තමේන්තුව විසින් මේ වන විට ඉටුකරනු ලබන කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

- ✓ සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා යෝජකයන් ලියාපදිංචි කිරීම
- ✓ සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම
- ✓ දායක මුදල් නොගෙවන සේවායෝජකයන්ගෙන් දායක මුදල් අයකර ගැනීම
- ✓ සාමාජිකයන් වෙත ප්‍රතිලාභ මුදල් ගෙවීම් සිදුකිරීම සඳහා ගෙවීම් නියෝග ලබාදීම
- ✓ අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

2.6.1 සේවක අර්ථසාධක අරමුදල සඳහා ආයතන ලියාපදිංචි කිරීම සහ සාමාජිකයන් ලියාපදිංචි කිරීම

සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ආවරණය වන සියලුම සේවායන් අරමුදලේ ලියාපදිංචි විය යුතුය. එසේම, සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් ආවරණය වන සියලු සේවකයින් වෙත සාමාජික අංක ලබා දී ඔවුන් අරමුදලේ ලියාපදිංචි කරවීම සේවායෝජකගේ වගකීම වන අතර එය අධීක්ෂණය කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.




ඡායාරූපය 2.2 - "සේවක අර්ථසාධක අරමුදල් අයදුම්පත් භාරදීමට වේලාවක් වෙන් කරවා ගැනීමේ පද්ධතිය" ගරු අමාත්‍යතුමා විසින් ආරම්භ කල අවස්ථාව

ඒ අනුව, සේවායෝජක ලියාපදිංචි අයදුම්පත් සහ ප්‍රතිලාභ අයදුම්පත් භාරදීමේ කටයුතු පහසු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 'සේවක අර්ථසාධක අරමුදල් අයදුම්පත් භාරදීමට වේලාවක් වෙන් කරවා ගැනීමේ පද්ධතිය' (EPF Appointment Management System) 2022.09.01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

2022 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට නව පද්ධතිය හරහා වේලාවක් වෙන් කරගත් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරය මගින් දැක්වේ.


ප්‍රස්ථාරය 2.3 - "සේවක අර්ථසාධක අරමුදල් අයදුම්පත් භාරදීමට වේලාවක් වෙන් කරවා ගැනීමේ පද්ධතිය" මගින් වේලාවක් වෙන් කරවාගත් සංඛ්‍යාව - 2022.09.01 දින සිට 2022.12.31 දින දක්වා



2.6.2 සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම


2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවූ සංඛ්‍යාව 166,110 ක් වන අතර ඒ පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරය මගින් දැක්වේ.

ප්‍රස්ථාරය 2.4 - 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවූ සංඛ්‍යාව



පසුගිය වර්ෂ හයක කාලය තුලදී දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතු කාර්යක්ෂම කිරීමට ගන්නා ලද පියවරයන්ගේ ප්‍රතිඵලයක් ලෙස සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් කටයුතු වල ක්‍රමික ප්‍රගතියක් දක්නට ඇති අතර 2017 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂය වන විට දින 14 ක් තුළ තීරණ ලිපි යැවූ ප්‍රතිශතය 43% සිට 66% දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව ප්‍රතිලාභ ගෙවීමේ කාර්යක්ෂමතාවය වර්ධනය වී ඇත.

ප්‍රස්ථාරය 2.5 - සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවීම සඳහා ගතවූ කාලය - 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා



2.6.3 දායක මුදල් ගෙවීම පැහැර හරින සේවායෝජකයන් වෙතින් දායක මුදල් අයකර ගැනීමට නිවේදන යැවීම

දායක මුදල් පැහැර හරින සේවායෝජකයන්ගෙන් එම මුදල් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම නිවේදන හා අවසන් නිවේදන නිකුත් කෙරෙන අතර ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මඟින් කටයුතු කර එම දායක මුදල් හා අධිභාර අයකර ගිණුම් ගත කිරීමට ක්‍රියා කරනු ලැබේ.

රූප සටහන 2.5 - 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා නිවේදන යැවීමේ ප්‍රගතිය

යැවූ පළමු නිවේදන සංඛ්‍යාව	පළමු නිවේදනවලින් අයකර ගත් මුදල රු.	යැවූ අවසන් නිවේදන සංඛ්‍යාව	අවසන් නිවේදන වලින් අයකර ගත් මුදල රු.
10,428	මිලියන 7614	8,409	මිලියන 5230









2.7 සේවකයන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා නෛතික රැකවරණය

සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවිය යුතු එම අණ පනත්හි ප්‍රතිපාදන දිවයින පුරා ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා එම නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.


ඒ අනුව, 2020.01.01. දින සිට 2022.12.31 දින දක්වා දෙපාර්තමේන්තුවේ නෛතික ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත වගු පරිදි වේ.

වගුව 2.4 - අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා

අධිකරණය	2022 වර්ෂයට ඉදිරියට ගෙන ආ ශේෂය	2022 වර්ෂයේ දී පවරනු ලැබූ නඩු සංඛ්‍යාව	2022.12.31 දිනට අවසන් වූ නඩු
ශ්‍රේෂ්ඨාධිකරණය	119	17	31
අභියාචනාධිකරණය	252	107	35
මහාධිකරණය	110	27	44
දිසා අධිකරණය සහ වානිජ මහාධිකරණය	216	11	20

සටහන - නීති ක්‍රියා අංශය මැදිහත්ව සිදු කරන ලද අධිකරණ කටයුතු පිළිබඳ තොරතුරු ඉහත වගුව මඟින් ඉදිරිපත් කර ඇත.

ප්‍රස්ථාරය 2.6 - මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු - 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා



සටහන - ප්‍රාදේශීය කම්කරු කාර්යාලයන්හි 2022 වර්ෂයේ නඩු කටයුතු පිළිබඳ ලැබී ඇති දත්ත අනුව සකස් කර ඇත.

මෙම වර්ෂයේ දී කම්කරු අණ පනත් සංශෝධනය සම්බන්ධයෙන් ද අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලදී. එම තොරතුරු 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා කාලය තුළ දෙපාර්තමේන්තුව විසින් අත්කර ගත් විශේෂ ජයග්‍රහණ යටතේ සඳහන් කර ඇත.

2.8 දෙපාර්තමේන්තුවේ මානව සම්පත කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම, අවශ්‍යතාවය පරිදි බඳවා ගැනීම් සිදු කිරීම, නිලධාරීන්ගේ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම්, කාර්ය සාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, නිලධාරීන් විශ්‍රාම ගැන්වීම, නිලධාරීන්ගේ නිවාඩු කටයුතු සහ කාර්ය මණ්ඩලයේ විනය කටයුතු යන දෛනික කාර්ය මණ්ඩල පරිපාලන කටයුතු 2022 වර්ෂයේදී ද සිදු කරන ලදී.

වගුව 2.5 - කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම 2022

තනතුර	කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ නම	විභාගය පැවැත්වූ දිනය	විභාගය සඳහා සහභාගී වූ සංඛ්‍යාව
ලඝුලේඛක	1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	2022.03.30	02
සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය)	1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	2021 වර්ෂයට අදාළ පරීක්ෂණය 2022.11.28, 29 සහ 30 යන දිනයන්හි දී පවත්වන ලදී	10
මානව සම්පත් සංවර්ධන නිලධාරි	1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	2022.09.06	01
ඒකාබද්ධ රියදුරු සේවය	I සහ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ	2022.10.04	I කාර්යක්ෂමතා කඩඉම සඳහා - 01 II කාර්යක්ෂමතා කඩඉම සඳහා - 05
කාර්යාල සේවක සේවය	I, II සහ III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ	2022.09.20	I කාර්යක්ෂමතා කඩඉම සඳහා - 03 II කාර්යක්ෂමතා කඩඉම සඳහා - 08 III කාර්යක්ෂමතා කඩඉම සඳහා -12
ඉංජිනේරු සේවය	1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය	2022.08.30	02
කම්කරු නිලධාරි	I සහ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ	2021 වර්ෂයට අදාළ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2022.02.10 දින පවත්වන ලදී.	12

එසේම, දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගෙන අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම, බාහිර ආයතන විසින් පවත්වන පුහුණු පාඨමාලා වෙත නිලධරයන් යොමු කිරීම, සේවා අවශ්‍යතාවය පරිදි විශ්ව විද්‍යාල උපාධි හා පශ්චාත් උපාධි හැදෑරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නිලධාරීන් වෙත සැපයීම සහ විදේශ පුහුණු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේ දී සෞඛ්‍යාරක්ෂිත බව සැලකිලිමත් වීම සහ ඉන්ධන භාවිතය අවම කිරීම සඳහා එම වැඩසටහන් Zoom මාධ්‍ය මඟින් පැවැත්වීම සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදී.

දේශීය පුහුණු වැඩසටහන් සඳහා 2022 වර්ෂය සඳහා රු. 5,800,000.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබී තිබුණි. එයින් 2022.12.31 දිනට වියදම රු. 5,311,943 ක් වන අතර වියදම ප්‍රතිපාදනයන්ගේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 92% කි.

වගුව 2.6 - 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් සඳහා සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන්

අ.අ.	වැඩසටහනේ ස්වභාවය		පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ නිලධරයන් සංඛ්‍යාව
1	බැහැරගත නායකත්ව පුහුණු වැඩසටහන්		02	176
2	සේවාරම්භක පුහුණු වැඩසටහන්		01	07
3	විෂයානුබද්ධ පුහුණු වැඩසටහන්	භෞතිකව පැවැත්වූ වැඩසටහන්	09	613
		මාර්ගගත ක්‍රමයට (Online) පැවැත්වූ වැඩසටහන්	11	958 (දළ වශයෙන්)

වගුව 2.7 - 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා දෙපාර්තමේන්තුව විසින් බාහිර පුහුණු ආයතනයන්හි පුහුණුව සඳහා නිලධාරීන් වෙත ප්‍රතිපාදන ලබා දීම්

අ.අ.	වැඩසටහන	ප්‍රතිපාදන ලබා දුන් නිලධාරීන් සංඛ්‍යාව
1	පශ්චාත් උපාධි	13
2	සහතික පත්‍ර පාඨමාලා	16
	එකතුව	**29**

මීට අතිරේකව 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා මාර්ග ගත ක්‍රමයට (Online) විවිධ විදේශීය සංවිධාන විසින් සංවිධානය කර පවත්වන ලද විදේශ පුහුණු වැඩසටහන් 27ක් සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් 49 දෙනෙකු සහභාගී වී ඇත.



ඡායාරූපය 2.3 - රත්නපුර දී පවත්වන ලද විධායක ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නායකත්ව හා පෞරුෂ සංවර්ධන පුහුණු වැඩසටහන - **2022.03.25** සහ 26 දෙදින



ඡායාරූපය 2.4 - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සම්පත් දායකත්වය ලබා දුන් පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන - **2022.03.28** දින



ඡායාරූපය 2.5 - දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සේවා මට්ටමේ නිලධාරීන් සඳහා පවත්වන ලද දෙමළ භාෂා පුහුණු පාඨමාලාවේ අවසන් දින උත්සවය සහ සහතික ලබා දීම - **2022.09.13**

2.8.1 දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය

දිවයින පුරා විසිරී සිටින සේවාලාභීන්ට වඩාත් ඵලදායී සේවයක් සලසා දීමේ අරමුණ පෙරදැරිව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි සහ දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාලයන් හි යටිතල පහසුකම් සංවර්ධනයට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

ඒ අනුව, අළුතින් ඉදි කරන ලද බදුල්ල සහ හැටන් කම්කරු කාර්යාල ගොඩනැගිලි හිටපු ගරු කම්කරු අමාත්‍යතුමා විසින් 2022 වර්ෂයේදී විවෘත කර කාර්යාල කටයුතු ආරම්භ කරන ලදී.




ඡායාරූපය 2.6 - අළුතින් ඉදි කර විවෘත කරන ලද හැටන් සහ බදුල්ල කම්කරු කාර්යාල ගොඩනැගිලි

2.9 තොරතුරු සන්නිවේදන කටයුතු


2..9.1 ප්‍රකාශන කටයුතු

කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා පහත ප්‍රකාශන එළි දක්වන ලදී.



- **Prime Work සඟරාව**

ආයතන වල සේවකයන් හා සේවායෝජකයන් අතර කම්කරු නීති හා ඒ හා බැඳුණු විෂයන් පිළිබඳ දැනුම සහ කතිකාවත වර්ධනයකර කාර්මික සාමය සුරක්ෂිත කිරීමේ අරමුණින් 2021 වර්ෂයේ දී ආරම්භ කරනු ලැබූ මෙම සඟරාවෙහි තෙවන කලාපය 2022 ජුනි මාසයේදී Attitudes යන තේමාව යටතේ විද්‍යුත් කලාපයක් (e-version) ලෙස දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකි වන පරිදි එළි දක්වන ලදී.



- **වැඩ කළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණය**

මෙම සමීක්ෂණය මගින් රටේ සංවර්ධන ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය ශ්‍රම පිරිවැය, වැඩකළ පැය ගණන හා සාමාන්‍ය ඉපයීම් පිළිබඳ දත්ත ලබා ගැනීම සිදු කෙරේ. එමගින් රජයේ සහ පෞද්ගලික අංශයේ සැලසුම් සම්පාදනය හා තීරණ ගැනීම සඳහා මෙන්ම සේවා සේවක දෙපාර්ශවයේ උන්නතිය වෙනුවෙන් සකස් කරනු ලබන ඉදිරි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා දීම සිදුකෙරේ. 2022 වර්ෂයේදී වැඩ කළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණයේ 2020 වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.



- **කම්කරු සංඛ්‍යාති වාර්ෂික වාර්තාව 2020 සහ 2021**

කම්කරු ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දත්ත ප්‍රකාශයට පත් කිරීම සහ දත්ත පරිශීලකයන් සඳහා අවශ්‍ය දත්ත ලබා දීමේ අරමුණින් සකස් කරනු ලබන 2020 සහ 2021 කම්කරු සංඛ්‍යාති වාර්ෂික වාර්තා2022 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලදී.

2.9.2 දෙපාර්තමේන්තුවේ නිල සමාජ මාධ්‍ය කටයුතු

දෙපාර්තමේන්තුව විසින් නිල යූ ටියුබ් වැනලයක්, ෆේස්බුක් පිටුවක් සහ ට්විටර් ගිණුමක් පවත්වාගෙන යමින් යාවත්කාලීනව තොරතුරු මහජනතාව වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

YouTube Channel	Subscribers: 859 Number of Videos included : 118
Facebook Page	Followers: 2900
Twitter	Followers: 56

2.9.3 දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය



සේවාලාභීන් සඳහා අවශ්‍ය අයදුම් පත්‍ර, ආකෘති පත්‍ර, උපදෙස් හා කම්කරු අණ පනත් මෙන්ම සේවායෝජකයන් විසින් අනුගමනය කළ යුතු පඩි පාලක සහා තීරණ ඇතුළු අවශ්‍ය ලේඛන බාගත කරගත හැකි වන පරිදි www.labourdept.gov.lk යන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර එම තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම, දෙපාර්තමේන්තුව සඳහා නව නිල වෙබ් අඩවියක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර 2022 වර්ෂය අවසන් වන විට වෙබ් අඩවියෙහි ප්‍රධාන අතුරු මුහුණතෙහි දළ සැකැස්ම සකස් කර අවසන් කරනු ලැබූ අතර දෙපාර්තමේන්තුවේ ඊ-සේවාවන් ලබා දෙන අංශයන්ට අදාළ කොටස් වල සංවර්ධනයන් තව දුරටත් සිදු කෙරමින් පවතී.

2.9.4 ජනමාධ්‍ය ආයතන විසින් සංවිධානය කරන ලද විවිධ වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තුවේ සහභාගීත්වය ලබා දීම

1. වරණ ටීවී මගින් සංවිධානය කරනු ලැබූ කාලත්‍රයේ කතාබහ සංවාද වැඩසටහනේ 2022.07.11 දින "පරිපාලන වගකීම් සහ සේවා සේවක යුතුකම්" යන මාතෘකාව යටතේ පැවති වැඩසටහන සඳහා කම්කරු කොමසාරිස් ජනරාල් ගේ සහභාගීත්වය ලබා දෙන ලදී.



2. ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයට සමගාමීව 2022.06.12 දින ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේ විකාශය වන "ඉරිදා ආයුබෝවන්" වැඩසටහන සඳහා කම්කරු කොමසාරිස් ජනරාල් සහ කාන්තා හා ළමා කටයුතු අංශයේ කම්කරු කොමසාරිස් ගේ සහභාගිත්වය ලබා දෙන ලදී. එම වැඩසටහන මගින් ළමා ශ්‍රමය සම්බන්ධ දැනුවත් කිරීම සිදු කරන ලදි.



3. ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානයේ ඇසිඳිසි පෙරමඟ කණ්ඩායම හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව එක්ව සංවිධානය කරනු ලබන ඇසිඳිසි පෙරමඟ සංවාද වැඩසටහනේ 2022.09.26 දින වැඩසටහන "මහජන සේවාවන් විධිමත් කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති නව පියවර" යන මාතෘකාව යටතේ කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ කම්කරු කොමසාරිස් සහ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ කම්කරු කොමසාරිස් සමඟින් පවත්වන ලදී.



2.9.5 ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම

- **ජාත්‍යන්තර කාන්තා දිනය 2022**



“රටකි දැයකි ලොවකි ඇය” තේමාව කරගත් 2022.03.08 දිනට යෙදුණු ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා දින වැඩසටහන කටුනායක අපනයන සැකසුම් කලාපයේ සේවිකාවන් 100 දෙනෙකු සඳහා හිටපු ගරු කම්කරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.03.09 දින කටුනායක ආයෝජන මණ්ඩල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

- **ලෝක ළමා දින සැමරුම**







ලෝක ළමා දින වැඩසටහන මැලිබන් ගෝල්ඩ් මාරි නිදහසේ රන් දරුවෝ අරමුදල හා එක්ව 2022.10.06 දින කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙහෙවර පියෙස නව ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.
එසේම, ලෝක ළමා දිනට සමගාමීව කළුතර දිස්ත්‍රික්කයේ දරුවන් 28 දෙනෙකු සඳහා පාසල් උපකරණ/පොත් කට්ටල බෙදා දීමේ වැඩසටහනක් 2022.10.07 දින බස්නාහිර කලාප II නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාලයේ දී ද ගම්පහ දිස්ත්‍රික්කයේ දරුවන් 25 දෙනෙකු සඳහා පාසල් උපකරණ/පොත් කට්ටල බෙදා දීමේ වැඩසටහනක් 2022.10.08 දින ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේ දී ද පවත්වන ලදි.
මෙයට අතිරේකව, ළමා ශ්‍රමය තුරන් කිරීම සම්බන්ධව “ මල් කැකුළු ඉකි බිඳිද්දී...ළමා ශ්‍රමය පිටු දකිමු” යන වාර්තාමය වැඩසටහනේ සිංහල මාධ්‍ය වැඩසටහන 2022.10.02 දින ප.ව.7.30 ට ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේ ද දෙමළ මාධ්‍ය වැඩසටහන 2022.10.01 දින ප.ව.2.00 ට චැනල් අයි (Channel eye) නාලිකාව ඔස්සේ ද විකාශය කරන ලදි.

- **ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින වැඩසටහන - 2022**

ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයට සමගාමීව ළමා ශ්‍රමය තුරන් කිරීම සම්බන්ධ කෙටි පණිවිඩයක් සමාජගත කිරීම සඳහා 2022.06.12 දින සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් Mobitel, Dialog, Hutch සහ Airtel යන ජංගම දුරකථන ජාල හරහා සිය පාරිභෝගිකයන් වෙත කෙටි පණිවිඩයක් සමාජ ගත කරන ලදි.



මෙයට අමතරව ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයට සමගාමීව 2022.06.12 දින ජාතික රූපවාහිනී නාලිකාව ඔස්සේ විකාශය වන ‘‘ඉරිදා ආයුබෝවන්’’ වැඩසටහන මගින් ළමා ශ්‍රමය සම්බන්ධ දැනුවත් කිරීම සිදු කරන ලදි.

- **ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය සතිය ජාතික වැඩසටහන**

ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය සතිය ජාතික වැඩසටහන කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.10.11 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී.




2.10. දෙපාර්තමේන්තුවේ කාර්යයන් අධීක්ෂණය මගින් ඉලක්කයන් කරා මෙහෙයවීම

2022 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ වන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන් හා ප්‍රාදේශීය කාර්යාල කටයුතු කරනු ලබන ආකාරය සහ ප්‍රගතිය පරීක්ෂා කරන ලදී. ඒ අනුව, කම්කරු කොමසාරිස්වරුන්ගේ මාසික රැස්වීම සෑම මාසයකදීම පවත්වන ලද අතර එහිදී එක් එක් අංශයන්හි ප්‍රගතිය සහ අංශයන්හි කටයුතු සිදු කරගෙන යාමේදී මතුවී ඇති ගැටළු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කරන ලදී.

එසේම, දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන් විසින් අදාළ වාර්ෂික ඉලක්ක කරා යොමු වීම අධීක්ෂණය ද සිදු කරන ලදී. දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල 26 ක කටයුතු වර්ෂය තුළදී පරීක්ෂාකර කර ඉදිරි උපදෙස් ලබා දෙන ලදී. 2021.12.31 දින දක්වා වන කාලසීමාව සඳහා ප්‍රාදේශීය කාර්යාලයන්හි ප්‍රධානීන්ගේ ප්‍රගති සමාලෝචන සම්මන්ත්‍රණය 2022.03.30 දින හිටපු කම්කරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

2.11 සුනිසි මෙහෙවර වැඩසටහන



සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. 8,314,449 ක ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත 2022 වර්ෂයේදී වෙන් කරන ලද අතර පහත සඳහන් පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

වගුව 2.8 - සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය - 2022

ව්‍යාපෘතිය සිදු කරනු ලැබූ අංශය	2022 වර්ෂය සඳහාවෙන් කරනු ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)	2022.12.31 දිනට වියදම (රු.)	ප්‍රතිපාදනයන්ගේ ප්‍රතිශතයක් ලෙස වියදම
මානව සම්පත් සංවර්ධන අංශය	1,423,010.00	1,315,215.00	92%
කාන්තා හා ළමා කටයුතු අංශය	4,202,034.00	2,213,902.80	53%
කර්මාන්තමය සුරක්ෂිතතා අංශය	125,000.00	125,000.00	100%
ශ්‍රම ප්‍රමිති අංශය	375,000.00	-	0%
සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය	2,189,405.00	489,405.20	22%
එකතුව	**8,314,449.00**	**4,143,523.00**	**50%**

2.12 මූල්‍ය කළමනාකරණය

2022 වර්ෂය සඳහා වාර්ෂික අයවැය මගින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලද මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස අදාළ අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

ඒ අනුව, 2022.12.31 දින වන විට වෙන් කරන ලද පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රතිපාදනයන්ගෙන් 92.33% ක ප්‍රතිශතයක් ද ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රතිපාදනයන්ගෙන් 61.58% ක ප්‍රතිශතයක් ද මේ සඳහා යොදා ගනිමින් මූල්‍ය කළමනාකරණ ඉලක්ක සපුරා ගෙන ඇත.

වගුව 2.9 - දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය - 2022

		2022.12.31 දිනට	ප්‍රතිපාදනයන් හි ප්‍රතිශතයක් ලෙස සත්‍ය වියදම
පුනරාවර්තන වියදම්	ප්‍රතිපාදනය (රු)	2,489,000,000	92.33%
	වියදම (රු)	2,298,070,940	
ප්‍රාග්ධන වියදම්	ප්‍රතිපාදනය (රු)	455,000,000	61.58%
	වියදම (රු)	280,210,599	

2.13 විශේෂ ජයග්‍රහණ, අභියෝග සහ ඉදිරි ඉලක්ක

2.13.1 විශේෂ ජයග්‍රහණ

1. සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ අයදුම්පත් භාරදීම සඳහා සහ සේවායෝජක ලියාපදිංචි කිරීම් සඳහා පැමිණෙන සේවාලාභීන්ගේ පහසුව උදෙසා සකස් කරන ලද 'සේවක අර්ථසාධක අරමුදල් අයදුම්පත් භාරදීමට වේලාවක් වෙන් කරවා ගැනීමේ පද්ධතිය' (EPF Appointment Management System) 2022.09.01 දින සිට ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, 1958 අංකය ඇමතීමෙන් හෝ appointment.labourdept.gov.lk යොමුව මගින් අදාළ කම්කරු කාර්යාල වෙතින් අවශ්‍ය සේවාව ලබා ගැනීම සඳහා දිනයක් සහ වේලාවක් වෙන් කරවා ගත හැකිය. මෙමගින් සේවාදායකයින්ට කාලය අපතේ යැවීමකින් තොරව නිශ්චිත වේලාවකදී සේවය ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.



2. සේවායෝජකයින්ගේ කටයුතු වඩාත් පහසු කිරීමේ පියවරක් ලෙස සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචිය සිදු කරන A, B හා H පත්‍රිකා කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් (www.labourdept.gov.lk) බාගත කර ගැනීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව සේවායෝජකයින්ට මෙම A, B හා H පත්‍රිකා කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් බාගත කරගෙන කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් සේවකයින් ලියාපදිංචි කළ හැකි වේ. එසේම, මෙමගින් A, B හා H පත්‍රිකා මුද්‍රණය සඳහා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව දරන පිරිවැය ඉතිරි කර ගැනීමට හැකි වී ඇත.

3. පැමිණිලි කළමනාකරණ පද්ධතියක් (Complaint Management System) ස්ථාපිත කිරීම



ශ්‍රී ලංකා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ සම්බන්ධීකරණයෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ අනුග්‍රහය මත කම්කරු දෙපාර්තමේන්තුව මගින් ඒ සඳහා පත් කරනු ලැබූ දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක උපදෙස් හා අධීක්ෂණය මත සකස් කරනු ලැබූ පැමිණිලි කළමනාකරණ පද්ධතිය 2022.03.15 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

මෙමගින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන පෞද්ගලික හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයෙකුට සිය රැකියාව සම්බන්ධ ඕනෑම පැමිණිල්ලක් https://cms.labourdept.gov.lk යන ඊ සේවාව මගින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා ඇත.

4. කම්කරු ක්ෂේත්‍රයට අදාළ පනත් සංශෝධනය කිරීම සහ නව පනත් හඳුන්වා දීම

පනතේ නම	සංශෝධන ගෙන ඒමේ අරමුණ
2022 අංක 22 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනත	1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත යටතේ ලබා දෙන බේරුම්කරණ ප්‍රදානයන්ට එරෙහිව අභියාචනා, ප්‍රතිශෝධන සහ රිට් නඩු ගොනු කිරීම අවම කිරීම
2022 අංක 24 දරන කාර්මික ආරවුල් (සංශෝධන) පනත	කම්කරු විනිශ්චය සභාවක් වෙත සේවය අවසන් කිරීම සම්බන්ධ අයදුම්පතක් ඉදිරිපත් කරනු ලබන සේවකයෙකු වෙනුවෙන් නීතීඥ නොවන නියෝජිතයෙකුටද පෙනී සිටීම සඳහා අවස්ථාව සලසා දීම
2022 අංක 23 දරන සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත	1971 අංක 45 දරන සේවය අවසන් කිරීමේ විශේෂ විධිවිධාන පනත යටතේ ලබා දෙන නියෝග වලට එරෙහිව අභියාචනා, ප්‍රතිශෝධන සහ රිට් නඩු ගොනු කිරීම අවම කිරීම

මෙයට අමතරව පහත පනත් සංශෝධනය / නව පනත් හඳුන්වාදීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

- වර්තමාන සමාජ ආර්ථික වෙනස්වීම් වලට ගැලපෙන පරිදි සහ නම්‍යශීලීවූ ද, සරලවූ ද කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණ පනත් සකස් කිරීමේ අරමුණින් කම්කරු අණ පනත් 09 ක පවතින රැකියා නියුක්තියට අදාළ සේවා තත්ත්වයන් සහ සේවා කොන්දේසි සංයුක්ත කර ඒකාබද්ධ නීතියක් හඳුන්වා දීම සඳහා මූලික කටයුතු ආරම්භ කරන ලද අතර එහි ඉදිරි කටයුතු 2023 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත. මෙමගින් රැකියාවක නියුතු වීමේදී අදාළ වන සේවා තත්ත්ව සහ සේවා කොන්දේසි සම්බන්ධයෙන් විෂමතාවයන් ඉවත් වීම, සේවායන් කම්කරු නීති සම්බන්ධයෙන් ස්වයං අනුගත වීම (Self Compliance) වර්ධනය, රැකියා ක්ෂේත්‍ර සඳහා කාන්තා සහභාගීත්වය වර්ධනය කිරීම සහ විදේශීය ආයෝජකයින්ට ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ආරම්භ කිරීම පහසු කිරීම සඳහා සේවා තත්ත්වයන් සහ සේවා කොන්දේසිවලට අදාළ නෛතික තත්ත්වයන් අවබෝධකර ගැනීම පහසු කිරීම මෙහි අරමුණ වේ.
- තොරතුරු තාක්ෂණය මත පදනම්ව ව්‍යාපාර කටයුතු කරන ආයතනවල (IT Enabling Services) කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට විධිවිධාන සැලසෙන පරිදි 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත සංශෝධනය කිරීම
- 1983 අංක 12 දරන පාරිතෝෂික පනත සහ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතසේවක සුරක්ෂිතතාවය තහවුරු වන පරිදි සහ වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීම

5. සේවක සුරක්ෂිතතාවය ඉහල නැංවීම සඳහා විධිමත් සුරක්ෂිතතා කමිටු පිහිටුවීම

කම්කරු දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් අවිස්සාවේල්ල ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ සුරක්ෂිතතා සහ සෞඛ්‍ය කමිටු ප්‍රවර්ධනය කර සේවක සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. අවිස්සාවේල්ල ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ විධිමත් ආකාරයේ සුරක්ෂිතතා කමිටු පිහිටුවා නොතිබූ බව නිරීක්ෂණය වූ බැවින් එක් එක් කර්මාන්තශාලා පරීක්ෂා කර වැඩපොළ සහයෝගීත්වයෙන් සුරක්ෂිතතා

කමිටු පිහිටුවන ලදි.ඒ අනුව, 2022.12.31 දින ආයෝජන කලාපය තුළ කර්මාන්තශාලා 29 ක විධිමත් කමිටු පිහිටුවන ලදී.

එසේම, 2022.10.11 දින ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය සතිය ජාතික වැඩසටහනේදී මාර්ගගත ක්‍රමය ඔස්සේ සුරක්ෂිතතා කමිටු පිහිටුවීමේ කටයුතු ආරම්භ කරන ලදි. ඒ අනුව 2022.12.31 දිනට මුළු දිවයිනම ආවරණය වන පරිදි සුරක්ෂිතතා කමිටු 241ක් පිහිටුවා ඇත.

6. කම්කරු ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර සංවිධාන සහ රටවල් සමඟ සබඳතා වර්ධනය කර ගැනීම

- ✓ 'කම්කරු පරීක්ෂණ මාර්ගෝපදේශ සංග්‍රහය' (Field Guide to Labour Inspections) සංශෝධනය කිරීම සඳහා සහ 'කම්කරු නීති සංග්‍රහය' (Compilation of Labour Laws) නව අණ පනත් මෙන්ම අණ පනත් වල සිදු වූ සංශෝධනයන්ද ඇතුළත් කර නැවත සකස් කර මුද්‍රණය කිරීමේ කාර්යය සඳහා දෙපාර්තමේන්තුව මගින් කමිටු දෙකක් පත් කර එම කටයුතු සිදු කරනු ලැබූ අතර මේ සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහ මූල්‍ය අනුග්‍රහය ලබා දෙන ලදී.

- ✓ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය දායකත්වය යටතේ දෙපාර්තමේන්තුවේ නිල යූ ටියුබ් චැනලය වෙත ඇතුලත් කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදල, කාර්මික සම්බන්ධතාවය, කාන්තාවන් තරුණ අය සහ ළමුන් සේවයේ යෙදවීම සහ ශ්‍රම ප්‍රමිතීන් සම්බන්ධයෙන් කෙටි වීඩියෝ පට එක් භාෂාවකින් 30 බැගින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම සකස් කර යූ ටියුබ් චැනලය වෙත ඇතුලත් කරන ලදී.


- ✓ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2022 ජූලි 19 වනදා නිකුත් කරන ලද 2022 එක්සත් ජනපද පුද්ගලයින් වෙළඳාම (මිනිස් ජාවාරම) පිළිබඳ වාර්තාව (US TIP REPORT 2022) සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමෙන් වාර්තාව සකස් කිරීම සඳහා රාජ්‍ය පාර්ශවකරුවන් වශයෙන් සම්බන්ධ වී දෙපාර්තමේන්තුවේ සහය ලබා දෙන ලදී. එම වාර්තාවට අනුව 2021 වර්ෂයේදී Tire 2 Watch List මට්ටමේ සිටි ශ්‍රී ලංකාව 2022 වර්ෂයේ දී Tire 2මට්ටමට පැමිණීම හේතුවෙන් රට තුළින් ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ගනු ලැබූ ඵලදායී පියවර හේතුවෙන් ශ්‍රී ලංකාවේ මට්ටම උසස් කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, ඒ සඳහා සහය දැක්වූ ආයතන අගයමින් ආරක්ෂක අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ඇගයීම් උත්සවයේදී කම්කරු දෙපාර්තමේන්තුව ද ඇගයීමට ලක් වන ලදී.



- ✓ සේවයේ නියුක්තව සිටියදී මියගිය සේවකයින් දස දෙනෙකුගේ පාසල් දරුවන් දස දෙනෙකු වෙත රුසියානු සංස්කෘතික මධ්‍යස්ථානයේ මූල්‍ය අනුග්‍රහය ඇතිව ශිෂ්‍යාධාර පිරිනමන ලදී. මෙම වැඩසටහන රුසියානු සමූහාණ්ඩුවේ මූල්‍ය අනුග්‍රහය මත ඉදිරි වර්ෂයේ දී ද සිදු කිරීමට අපේක්ෂිතය.



7. කඩදාසි භාවිතය අවම කරමින් පිරිමැසුම්දායී සහ කඩිනම් අභ්‍යන්තර සන්නිවේදන මාධ්‍යයක් ලෙස Slack යෙදවුම භාවිතය වර්ධනය කිරීම




දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර දැනුවත් කිරීම් කඩිනමින් දෙපාර්තමේන්තු නිලධරයින් අතරට ගෙනයමින්, කඩදාසි භාවිතය අවම කරමින් සහ තැපැල් පිරිවැය අවම කරමින් රාජකාරිමය අභ්‍යන්තර සන්නිවේදන මාධ්‍යයක් ලෙස Slack යෙදවුම සාර්ථකව භාවිතා කරන රාජ්‍ය ආයතන අතරින් ප්‍රමුඛ ස්ථානයක් දෙපාර්තමේන්තුව හිමි කර ගෙන ඇත.

2.13.2 මෙම කාලසීමාවේදී මුහුණ දුන් අභියෝග

- දෙපාර්තමේන්තුව සතු සීමිත මූල්‍ය සහ මානව සම්පත් උපයෝගී කර ගනිමින් දෙපාර්තමේන්තුවේ 2022 වාර්ෂික ඉලක්ක සාක්ෂාත් කර ගැනීම
- කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය සහ වසරේ පළමු මාස කිහිපය තුළදී රට තුළ පැවති ගැටළුකාරී තත්ත්වය හමුවේ දෙපාර්තමේන්තුවේ දෛනික රාජකාරි කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාම

2.14 2023 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලසුම්

- ❖ සේවකයින්ගේ සේවා තත්ත්වයන් සහ සේවා කොන්දේසි වලට අදාළව දැනට කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන අණ පනත් 09ක් ඒකාබද්ධ කර ඒකාබද්ධිත පනතක් සකස් කර නීතියක් බවට පත් කිරීම සහ වර්තමානයට සහ අනාගතයට ගැලපෙන පරිදි අනෙකුත් කම්කරු අණ පනත්ද සංශෝධනය කිරීම
- ❖ දෙපාර්තමේන්තුවේ නව නිල වෙබ් අඩවිය 2023 වර්ෂය තුළදී සංවර්ධනය කර අවසන් කිරීම
- ❖ සේවක අර්ථසාධක අරමුදල් අංශය මගින් සේවාලාභීන් වෙත ලබා දෙන සේවාවන් විද්‍යුත් සේවාවන් වශයෙන් තව දුරටත් පුළුල් කිරීම.
- ❖ සියලු දිස්ත්‍රික්ක 2025 වන විට 'ළමා ශ්‍රමයෙන් තොර කලාප' ලෙස තහවුරු කිරීම සඳහා 2023 වසර තුලදී දිස්ත්‍රික්ක 10ක් තුළ (මහනුවර, නුවරඑළිය, පුත්තලම, ත්‍රිකුණාමලය, මාතර, මොණරාගල සහ 2022 වර්ෂයේ ව්‍යාපෘතිය සිදු කරනු ලැබූ දිස්ත්‍රික්ක වන බදුල්ල, ගාල්ල, ගම්පහ සහ කළුතර) ළමා ශ්‍රමය අවදානම වැඩි වශයෙන් පවතින ප්‍රදේශයන් 10ක් (ගම්) තෝරාගනිමින් එම ප්‍රදේශ ළමා ශ්‍රමය ශූන්‍ය කලාප ලෙස තහවුරු කිරීම.
- ❖ පෞද්ගලික අංශය හා එක්ව මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ පොදු පහසුකම් සැපයීම වැඩි දියුණු කිරීම.



බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
කම්කරු කොමසාරිස් ජනරාල්

තෙවන පරිච්ඡේදය

2022 දෙසැම්බර් 31 දිනෙන්

අවසන් වූ වසර සඳහා වන

සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒඑසී-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කත්‍ය 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඑසී-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,431,000,000	1,547,010,000	ඒඑසී-3
-	තැන්පතු		2,635,879,570	1,508,180,043	ඒඑසී-4
-	අත්තිකාරම් ගිණුම්		102,023,080	96,410,060	ඒඑසී-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		4,168,902,650	3,151,600,103	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**4,168,902,650**	3,151,600,103	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		62,802,436	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		4,106,100,214	3,151,600,103	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
1,712,800,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,639,335,410	1,481,679,367	
751,060,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	642,584,824	558,114,818	ඒඑසී-2(ii)
24,932,515	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	15,943,222	40,309,607	
-	පොළී ගෙවීම්	8	-	-	
207,485	වෙනත් පුනරාවර්තන වියදම්	9	207,484		
2,489,000,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**2,298,070,940**	2,080,103,792	
	මූලධන වියදම්				
85,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	52,592,170	60,002,143	
363,700,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	222,306,486	763,904,607	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒඑසී-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
5,800,000	හැකියා වර්ධනය	14	5,311,943	2,355,554	
-	වෙනත් මූලධන වියදම්	15	-	2,705,093	
455,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**280,210,599**	828,967,397	
	තැන්පතු ගෙවීම්		2,578,419,939	1,660,727,824	ඒඑසී-4
	අත්තිකාරම් ගෙවීම්		97,932,971	103,607,793	ඒඑසී-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		2,676,352,910	1,764,335,617	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		5,254,634,449	4,673,406,806	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(1,148,534,235)	(1,521,806,703)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(1,148,534,235)	**(1,521,806,703)**	ඒඑසී-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒඑසී-3
			(1,148,534,235)	(1,521,806,703)	

3.2 2022.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

				ඒසීඒ-පී
2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය				
		සටහන	තත්‍ය **2022** රු.	 **2021** රු.
මූල්‍ය නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ		ඒසීඒ-6	17,712,212,860	17,538,212,207
මූල්‍ය වත්කම්				
අත්තිකාරම් ගිණුම්		ඒසීඒ-5/5(ඒ)	256,543,819	260,643,928
මුදල් හා මුදල් සමාන දෑ		ඒසීඒ-3	-	-
මුළු වත්කම්			**17,968,756,679**	**17,798,856,135**
ශුද්ධ වත්කම් / ස්කන්ධය				
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්			(511,194,166)	(449,634,426)
දේපළ පිරියත හා උපකරණ සංචිතය			17,712,212,860	17,538,212,207
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය		**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්				
තැන්පතු ගිණුම්		ඒසීඒ-4	767,737,985	710,278,354
අග්‍රිම ශේෂය		ඒසීඒ-3	-	-
මුළු වගකීම්			**17,968,756,679**	**17,798,856,135**

ඒසිඒ-පී

2022.12.31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පිටු අංක 10 සිට 48 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 49 සිට 61 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය : 2023.02.24
දිනය : 2023.02.27	දිනය : 2023.02.27	
ආර් පී ඒ විමලවීර ලේකම් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය 7 වැනි මහල, "මෙහෙවර පියස" නාරාහේන්පිට, කොළඹ 05.	නීතිඥ බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති කොමසාරිස් ජනරාල් කම්කරු දෙපාර්තමේන්තුව කොළඹ 05	පී. පේයඩාස්කර් ප්‍රධාන ගණකාධිකාරි කම්කරු දෙපාර්තමේන්තුව කොළඹ - 05

3.3 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	1,181,152,646	1,297,454,447
අග්‍රිම ලැබීම්	1,431,000,000	1,547,010,000
අත්තිකාරම් අයකර ගැනීම්	109,231,636	100,880,257
තැන්පතු ලැබීම්	2,635,879,570	1,508,180,043
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**5,357,263,852**	**4,453,524,747**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,277,464,979	2,060,553,232
සහනාධාර සහ මාරුකිරීම්	15,943,222	18,538,000
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	114,003,608	22,488,951
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	62,802,436	-
අත්තිකාරම් ගෙවීම්	98,040,971	102,923,532
තැන්පතු ගෙවීම්	2,578,419,939	1,660,727,824
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**5,146,675,155**	**3,865,231,540**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**210,588,697**	**588,293,207**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	210,588,697	588,293,207
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**210,588,697**	**588,293,207**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(210,588,697)**	**(588,293,207)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය
2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම
මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම
හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම් හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය
මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ
2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළ නොවේ.					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම රු.	උපයෝගී කරනුලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ %ක් ලෙස
	මුල් ප්‍රතිපාදන රු.	අවසන් ප්‍රතිපාදන රු.		
පුනරාවර්තන	2,489,000,000	2,489,000,000	2,298,070,940	92%
මූලධන	455,000,000	455,000,000	280,210,599	62%


3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව		ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ %ක් ලෙස
				මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
01.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	253-1-2-4-1502-11	විශ්‍රාමික නිලධාරීන්ගේ ණය ශේෂ පවරා ගැනීම.	1,954,905.00	1,954,905.00	1,954,905.00	100%
02.	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	130-1-2-0-1001-11	උපාධිධාරී පුහුණු නිලධාරීන්ගේ දීමනා ගෙවීම.	66,829,321.13	66,829,321.13	66,829,321.13	100%
03.	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	130-1-2-0-1003-11	උපාධිධාරී පුහුණු නිලධාරීන්ගේ දීමනා ගෙවීම.	32,354,622.34	32,354,622.34	32,354,622.34	100%
04.	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය	193-1-2-0-1403-11	අමාත්‍යාංශයේ ජල හා විදුලිය වෙනුවෙන් වියදම් දැරීම	3,284,084.92	3,284,084.92	3,284,084.92	100%
05.	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය	193-1-2-0-1403-11	අමාත්‍යාංශයේ බදු කුලී වියදම් දැරීම	2,485,662.00	2,485,662.00	2,485,662.00	100%
06.	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය	193-1-2-0-1409-11	මෙහෙවර පියෙස පහසුකම් කළමනාකරණ ගාස්තු	2,951,489.14	2,951,489.14	2,951,489.14	100%
07.	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය	193-1-2-2-2509-11	සුනිසි මෙහෙවර වැඩසටහන වෙනුවෙන් වියදම් දැරීම	4,143,523.00	4,143,523.00	4,143,523.00	100%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,485,266,705.56	1,485,266,705.56		100%
9152	යන්ත්‍රෝපකරණ	749,390,144.78	749,390,144.78		100%
9153	ඉඩම්	2,262,720,000.00	2,262,720,000.00		100%
9154	අස්පෘශ්‍ය වත්කම්	39,561,696.00	39,561,696.00		100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරිගෙන යන වැඩ	13,175,274,314.00	13,175,274,314.00		100%
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. LSW/B/DOL/SR/1/2022 මඹේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 ජූනි 09 දින

ගණන්දීමේ නිලධාරී,
කම්කරු දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 221, කම්කරු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 221, කම්කරු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය නොවන වත්කම්වල ඇතුලත් අයිතම් 05 ක භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල ආරම්භක ශේෂ 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සමඟ සැසඳීමේදී රු.18,643,128 ක වෙනසක් නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමණාකරණය

(අ) වැය විෂයයන් 19 කට අදාලව සලසා තිබූ රු.108,565,000 ක ප්‍රතිපාදනයෙන් 2022 වර්ෂය අවසන් වන විට උපයෝජනය කර තිබුණේ රු.43,093,990 ක් පමණි. මෙම වැය විෂයන්ගේ ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 50 සිට සියයට 100 දක්වා විය.

(ආ) මූලධන වැය විෂයන් අතර රු. 36,952,781 ක ප්‍රතිපාදන මාරු කිරීමේදී මු.රෙ.66 (4)(අ) වගන්තිය ප්‍රකාරව අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) 2022 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය අයවැය වක්‍රලේඛ අංක 03/2022 හි 03 (xvii) ප්‍රකාරව ප්‍රතිපාදනවල ඉතිරිවීම් සම්බන්ධව කටයුතු කලයුතු වුවද, 2022 වර්ෂය සඳහා මූලධන වැය විෂයය 03 කට වෙන් කරන ලද ප්‍රතිපාදන, වෙනත් මූලධන වැය විෂයයන් සඳහා වියදම් කර තිබුණි. එලෙස ප්‍රතිපාදන මාරු කරන ලද වැය විෂයයන් සඳහා

රු.5,579,872 ක ප්‍රතිපාදන යටෝක්ත චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසුව වියදම් කර නිබුණි.

2.2 අත්තිකාරම් ගිණුම

(අ) වැඩ තහනමට ලක්වී වසර 05 කට වැඩි කාලයක් ගත වී ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.43,920 ක ආපදා ණය ශේෂයද, විශ්‍රාම ගොස් වසර 04 කට වැඩි කාලයක් ගතවූ නිලධාරිනියකගෙන් අයවිය යුතු රු.138,040 ක ආපදා ණය ශේෂයද මෙම වාර්තාවේ දින වන විටත් අය වී නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ මියගිය නිලධාරියෙකුට හා 2021 වර්ෂයේ මියගිය නිලධාරීන් 06 දෙනෙකුට අදාල ණය ශේෂ පිළිවෙලින් රු.123,960 ක් හා රු.535,607 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කාල විශ්ලේෂණ වාර්තාවේ ඇතුලත් මියගිය නිලධාරියෙකුගේ රු.143,750 ක් වූ ණය ශේෂය, මිය ගිය හා විශ්‍රාම ගිය ලේඛණයේ ඇතුලත්ව නොතිබුණි.

2.3 තැන්පතු ශේෂ

(අ) දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන පොදු තැන්පත් ගිණුම් 2 ක 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.767,737,985 ක් වූ අතර එම ශේෂය රු.175,653,978 ක් අවුරුදු 2 ට වඩා කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (2) හා (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කම්කරු දෙපාර්තමේන්තුවට හා දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල සේවක අර්ථ සාධක අරමුදලට අදාලව එකතුව රු.282,726,669 ක් අදාල කේවල ගිණුම් වලට බැර කිරීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2022 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශය (SA-92) අනුව බැරකම් ශේෂය රු.18,811,256 ක් වූ අතර එදිනට ගිණුම් ප්‍රකාශවල දක්වා තිබූ බැරකම් ශේෂය රු.23,180,626 ක් විය.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	නිරීක්ෂණ
(අ) 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත	
i. 34 (6) වගන්තිය	වාෂ්ප බොයිලේරුවක් යටත් පිරිසෙයින් සෑම මාස 14 කට වරක් පරීක්ෂා කල යුතු අතර, බරපතල අළුත්වැඩියාවකින් පසුව බලයලත් නිලධාරියෙකු පරීක්ෂා කර අත්හදා බැලිය යුතුය. මෙම අවශ්‍යතාවය මත සෑම බොයිලේරුවක්

	සම්බන්ධවම සිදුවන බවට සෑහීමට පත්වීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය විසින් සකස් කර නොතිබුණි.
ii. 92 වගන්තිය	කර්මාන්තශාලාවේ සිදුවන හදිසි අනතුරු සහ කාර්මික රෝග සම්බන්ධ විස්තර සාමාන්‍ය ලේඛණයේ සඳහන් කර එහි පිටපත් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය වෙත එවිය යුතු වුවද එවැනි තොරතුරු දත්ත ලබාගැනීමේ ක්‍රමවේදයක් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලයේ නොතිබුණි.
(ආ) කම්කරු කොමසාරිස් ජනරාල්ගේ 1999 පෙබරවාරි 11 දිනැති අංක 01/99 දරණ චක්‍රලේඛයේ 1.1, 1.1(3), 5.2 වගන්ති	සේවක අර්ථසාධක අරමුදලේ හිඟ දායක මුදල් හා අධිභාර මුදල් අයකර ගැනීමේදී මුල් පරීක්ෂණ අවස්ථාවේ නිවැරදි තොරතුරු රැස්කර ගැනීම, සේවක ප්‍රකාශන ලබා ගැනීම, විධිමත් පරීක්ෂණ වාර්තා පවත්වාගෙන යාම, අධිභාර නිවැරදිව ගණනය කිරීම, සේ.අ.අ/නී.ක්‍රි/ 05 දරණ ලේඛණය පවත්වාගෙන යාම චක්‍රලේඛ ප්‍රකාරව සිදුකර නොතිබුණි.
(ඇ) 2019 සැප්තැම්බර් 27 අංක 2142/90 ගැසට්පත්‍රය	(i) ගැසට් නිවේදනයේ විධිවිධාන ප්‍රකාරව භූමාල බොයිලේරු සහ වෙනත් පීඩන භාණ්ඩ ලියාපදිංචි කිරීමේ විධිවිධාන සැලැස්විය යුතු වුවත්, කර්මාන්තශාලා පරීක්ෂාවේදී වෙනත් පීඩන භාජන, වායුම් රිසීවර, වායු රිසීවර භාජන පරීක්ෂා කිරීමේ විධිවිධාන ඇතුලත් කර නොතිබුණි. (ii) සේවකයන් අධික ශබ්දයෙන් ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයන් ඇති බවටත්, කර්මාන්තශාලාවේ ප්‍රමාණවත් ආලෝක සැපයුමක් ඇති බවටත් තහවුරු කල යුතු වුවද, කර්මානතශාලා පරීක්ෂාවේදී භාවිත කරනු ලබන නිරීක්ෂණ ලැයිස්තු (check list) එම පරීක්ෂා කිරීම් සටහන් කිරීමට අවශ්‍ය පරිදි නව ගැසට් පත්‍රයේ නියෝගවලට අනුකූල වන පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

2.6 අවධිමත් ගණුදෙනු

කම්කරු දෙපාර්තමේන්තුවට අයත් රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු කඩිනමින් ඉටුකරවා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 පරිච්ඡේදයේ පරිදි ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කිරීමකින් තොරව රු.11,177,000 ක්වූ ප්‍රසම්පාදනය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුණි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් මෙම

කොන්ත්‍රාත්තුව රු.9,590,303 ක වටිනාකමකට පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයකට උපකොන්ත්‍රාත් පිරිනමා තිබුණි. ඇස්තමේන්තු වටිනාකම් තුල වූ කළමණාකරණ ගාස්තුව රු.449,960 ක් වූ නමුත් ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු නිසි පරිදි අධීක්ෂණය වී නොමැති අතර, වරින් වර පෙන්වා දෙන ලද අඩුපාඩු කොන්ත්‍රාත්කරු විසින් සකස් කර දී නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) කර්මාන්තශාලා අයිතිකරු හෝ පදිංචිකරු වීම සඳහා 2019 සැප්තැම්බර් 27 දිනැති අංක 2142/90 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ විධිවිධානවලට අනුව ලියාපදිංචිය යුතු වුවත් 2022 වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික් කර්මාන්තශාලා ඉංජිනේරු කාර්යාලය තුල පවත්වාගෙන ගිය ගොනු සංඛ්‍යාව 32,948 කින් නව නීතිරීති අනුව ලියාපදිංචි වූ සංඛ්‍යාව 3,153 ක් විය. අවම ලියාපදිංචි ගාස්තුව වූ රු.1,000 සැලකුවිට (ගාස්තු රු.1,000 - රු.10,000) ලියාපදිංචි නොවූ කර්මාන්තශාලා සඳහා ලබාගත හැකි ලියාපදිංචි ගාස්තුව රු.29,795,000 ක් දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි.

(ආ) කර්මාන්ත ශාලා ආඥා පනතේ විධිවිධානවලට අනුව කටයුතු නොකිරීම හේතුවෙන් නඩු පැවරීමට 2010–2018 කාල සීමාව තුල ගොනු 52 ක් ලැබී තිබුණු නමුත් ඉන් නඩු පැවරීම සිදුකර තිබුණේ ගොනු 11 ක් සම්බන්ධයෙන් පමණි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිද්ධීන් 09 ක් සම්බන්ධයෙන් නඩු පැවරීමට කර්මාන්ත සුරක්ෂිතතා අංශය විසින් අනුමැතිය ලබා දී මාස 05 සිට වසර 02 ක් ඉක්මවා තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පෞද්ගලික අර්ථසාධක අරමුදල් අධීක්ෂණය

(i) 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 27 වගන්තිය ප්‍රකාරව අනුමත කරන ලද අර්ථසාධක අරමුදල් හා අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රම පරිපාලනය සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර මෙම අරමුදල විධිමත්ව පරිපාලනය සහ අධීක්ෂණය සඳහා කම්කරු දෙපාර්තමේන්තුව පුද්ගලික අර්ථසාධක අරමුදල් අංශයක් පිහිටුවා තිබුණි. දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් (PPF) 117 කින් ආයතන 87 ක පමණක් ශේෂයන් හඳුනාගෙන තිබුණි. අරමුදල්වල ශේෂයන් ඉදිරිපත් නොකල ආයතනවල තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණු අතර, මෙම අරමුදල් සම්බන්ධ නිසි අධීක්ෂණයක් සිදු වී නොතිබුණි.

(ii) මෙම අරමුදල සම්බන්ධයෙන් 2017 වර්ෂයේ සිට 2021 දක්වා පැමිණිලි 291 ක් ඉදිරිපත්ව තිබූ අතර, මෙයින් පැමිණිලි 68 ක් විසඳා නොතිබුණි.

(iii) පනතේ 27(2)(අ) වගන්තිය ප්‍රකාරව යම් මාසයක දායක මුදල් ඊළඟ මාසයේ අවසන් දිනට ගෙවිය යුතු වුවත් සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් පවත්වාගෙන යනු ලබන පෞද්ගලික සේවක අර්ථ සාධක අරමුදල සඳහා විධිමත්ව දායක මුදල් බැර

නොකිරීම නිසා 2019 – 2021 කාලයට අදාලව රු.108,218,673 ක අධිභාර ගෙවීම් පැහැර හැර තිබුණි.

(ඇ) වෘත්තීය සමිති අංශය

1935 අංක 14 වෘත්තීය සමිති ආඥා පනත, 1946 අංක 03 දරන ආඥා පනත, 1948 අංක 15 දරන ආඥා පනත, 1958 අංක 18 දරන ආඥා පනත, 1970 අංක 24 දරන ආඥා පනත යන අණපණත් මගින් වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම, පාලනය සහ ක්‍රියාත්මක වීම, පාලනය සිදුකරගෙන යන අතර, මෙම අණපණත් වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කර නොතිබූ බව පරීශීලනයේදී නිරීක්ෂණය විය. මේ පිළිබඳව හඳුනාගත් අංශ කිහිපයක් සංශෝධනය කිරීමට 2019 වර්ෂයේ සිට සාකච්ඡා කර තිබුණද මේ සම්බන්ධව ප්‍රගතියක් නිරීක්ෂණය නොවීය.

2289/43 දරණ 2022 ජූලි මස 22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අනුව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ කාර්ය හා කර්තව්‍ය ලෙස වෘත්තීය සමිති ලියාපදිංචිය, සියලු රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීමට සාධනීය පියවර හඳුන්වාදීම ක්‍රියාත්මක කලයුතු වුවද එවැනි පියවර ගෙන තිබූ බව නිරීක්ෂණය නොවීය.

3.1.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 4 වන මහල ආපන ශාලාව සහ 8,9,10,11,12,13,14 යන මහල්වල අභ්‍යන්තර නිර්මිත හා පාටිෂන් කටයුතු සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2021 දෙසැම්බර් 31 දින වන විට රු.460,326,053 ක් ගෙවා තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් එම කටයුතු අවසන් වී නොතිබුණි.

3.2 පාඩු හා හානි

පාඩු හා හානි ලේඛණයට අනුව 2022 වර්ෂයේදී අවස්ථා දෙකකදී වාහන අනතුරු සිදුවූ බවට සටහන් කර තිබුණි. අනතුරු සම්බන්ධව මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාර ප්‍රාරම්භක වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර, 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් මෙම අනතුරු දෙක සහ වෙනත් සිදු වූ කිසිදු පාඩුවක් හෝ හානියක් පිළිබඳව අනාවරණය කර නොතිබුණි.

3.3 කළමණාකරණ දුර්වලතා

(අ) ධර්මපාල මාවත, රත්නපුර ලිපිනයේ පිහිටි කම්කරු දෙපාර්තමේන්තුවට අයත් රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය පිහිටි පැරණි ගොඩනැගිල්ල පස් කදු කඩාවැටීමෙන් ජීවිත අවධානම් තත්ත්වයකට මුහුණ දී තිබීම හේතුවෙන් 2015 වර්ෂයේ සිට එම ස්ථානයෙන් ඉවත් වී මසකට රු.175,000 ක් බැගින් වූ කුලී ගොඩනැගිල්ලක ස්ථාපිත කර තිබුණි. කුලී ගොඩනැගිල්ලේ ගිවිසුම් කාලය 2021 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වන බැවින් 2021 ජූලි 07 දින රැස්වූ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කාර්යය රු.11,177,000 ක මුදලකට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් ඉටුකරවා ගැනීමට තීරණය කර තිබුණි. අළුත්වැඩියාව ඇරඹීමට පෙර ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නායයාම් පරීක්ෂණ හා අවධානම් කළමණාකරණ අංශය මගින් 2019 අගෝස්තු 31 දින නිකුත්

කරන ලද මූලික සමීක්ෂණ වාර්තාවේ කෙටිකාලීන නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබූ අතර, අළුත්වැඩියාවෙන් පසුවද නැවත 2021 මැයි 17 ආසන්න දිනයකදී ද පස් කදු කඩා වැටීමක් සිදු වී තිබූ බව දන්වා තිබුණි. මෙම අලුත්වැඩියාවන් නිසි පරිදි කාලීනව සිදුකර නැවත කර්යයාලය භාවිතයට ගැනීමට 2023 වර්ෂයේදීද නොහැකිව පවතින අතර, 2020 ඔක්තෝම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා මාසකට රු.280,000 බැගින් බදු කුලී වශයෙන් බාහිර පාර්ශවයකට රු.7,560,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පිහිටුවා ඇති කාන්තා නේවාසිකාගාරය අළුත්වැඩියා කටයුතු සඳහා 2018 ජූනි 15 දින සිට වසා තිබූ අතර, එම අළුත්වැඩියා කටයුතු 2023 වර්ෂය වන විටත් සිදුකර නොතිබුණි. නේවාසිකාගාරය නැවත පිළිසකර කිරීම මගින් ආයෝජන කලාපය තුල සේවය කරන පිරිස් වෙත නවාතැන් පහසුකම් සපයාගැනීමේ අවස්ථාව අහිමි වී ඇති අතර, මෙම නේවාසිකාගාරයේ ආරක්ෂාව සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2018 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් දක්වා රු.4,245,678 ක මුදලක් වැයකර තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත, තථ්‍ය හා පූරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
(i) ජ්‍යෙෂ්ඨ මට්ටම	211	133	78
(ii) තෘතීය මට්ටම	668	478	190
(iii) ද්විතියික මට්ටම	1,753	1,718	35
(iv) ප්‍රාථමික මට්ටම	489	401	88
එකතුව	3,121	2,730	391

2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පවතින සේවක නිහය, නිරණ ගැනීම්, වගකීම් භාරගැනීම්, අධීක්ෂණය, ක්ෂේත්‍ර රාජකාරි යනාදි අංශයන්හි අපේක්ෂිත කාර්යසාධනය ළඟා කර ගැනීමට මෙන්ම ඵලදායීතාවය අඩුවීම් කෙරෙහිද බලපෑම් සිදුවී ඇති බව නිරීක්ෂණය කෙරේ.

එම්.වී.අයි.ගමගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

සිව්වන පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
1.සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි දින 14 ක් තුළ යැවීමේ ප්‍රතිශතය			67%
2. සමස්ත කාර්ය මණ්ඩලයෙන් පුහුණුව ලැබූ සංඛ්‍යාවෙහි ප්‍රතිශතය			70%
3. දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලද සමස්ත ප්‍රතිපාදනයන්ගෙන් උපයෝජනය කරන ලද ප්‍රතිශතය		87.5%	
4. ළමා ශ්‍රමයක් ඇති බවට වර්ෂය තුළදී අණාවරණය වූ පැමිණිලි වලින් වර්ෂය තුළ දීම නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලද සංඛ්‍යාවේ ප්‍රතිශතය			54.5%
5. සමාජ කතිකාව උදෙසා පවත්වන ලද වැඩසහන් සංඛ්‍යාව ඉලක්කයෙහි ප්‍රතිශතයක් ලෙස	100%		

සටහන - ඉදිරි වර්ෂය සඳහා කාර්ය සාධන දර්ශක සකස් කිරීමේදී 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව, දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වැඩිදුරටත් සාර්ථකව මැනුම් කළ හැකි ප්‍රතිඵල පාදක කර ගත් කාර්ය සාධන දර්ශක මගින් මැනීමට අපේක්ෂිතය.

පස්වන පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDGs)

සපුරා ගැනීමේ කාර්යසාධනය

5. තිරසර සංවර්ධන අරමුණු (SDGs) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාව විසින් සාක්ෂාත් කර ගත යුතු තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් අතරින්, කම්කරු දෙපාර්තමේන්තුවේ මෙහෙවර අනුව 08 වන අභිමතාර්ථය දෙපාර්තමේන්තුව වෙත සෘජුව අදාළ වේ. එනම්, **සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම** යන අභිමතාර්ථය වේ. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර මෙම අභිමතාර්ථය හා සමපාත වන අතර දෙපාර්තමේන්තුවේ සියලු ක්‍රියාකාරකම්හි අවසාන නිමැවුම වනුයේ මෙම අභිමථාර්තය සාර්ථකව සාක්ෂාත් කර ගැනීම වේ. ඒ අනුව ගත් කල දෙපාර්තමේන්තුවේ සමස්ත ප්‍රගතිය මගින් 08 වන අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය විද්‍යමාන වේ.

මේ හැරුණු කොට 01 වන අභිමතාර්ථය වන සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම, 05 වන අභිමතාර්ථය වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සහ 16 වන අභිමතාර්ථය වන තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීමයන අභිමතාර්ථද දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් අනුව අඩු වැඩි වශයෙන් අදාළ වේ.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ

ඉලක්කය / අරමුණ		ඉලක්ක		ජයග්‍රහණ දර්ශක		2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය
01	සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	1.1	2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම. වර්තමාන තක්සේරුව අනුව දිනකට ඩොලර් 1.25ට වඩා අඩුවෙන් අදායම් ලබන අය අන්ත දිළිඳු කාණ්ඩයට අයත් වේ.	1.1.1	ස්ත්‍රී පුරුෂභාවය, වයස, සේවා නියුක්ති මට්ටම සහ භූගෝලීය පිහිටීම (නාගරික, ග්‍රාමීය) යන සාධකයන්ට අනුව අන්තර්ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහල ජනගහණයේ අනුපාතය	බේකරි කර්මාන්තය, ගුදරි කොහු හා ඇට කෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය, නාවික ප්‍රවාහන හා මෙහෙයුම් සේවා කර්මාන්තය, බතික් කර්මාන්තය, පෙර පාසැල් කර්මාන්තය, බීඩී සෑදීමේ කර්මාන්තය සහ මල් විසිතුරු පැල එළවළු හා පළතුරු වගා කිරීමේ හා පිටරට යැවීමේ කිරීමේ කර්මාන්තය පඩිපාලක සභාවල අවම වැටුප් සංශෝධනය කර යාවත්කාලීන කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදී.
05	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම	5.1	කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථායන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම	5.1.1 .	ස්ත්‍රී පුරුෂභාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවතින්නේද නැද්ද යන්න	• 2022 වර්ෂයේ කාන්තා දිනය නිමිති කොටගෙන “රටකි දැයකි ලොවකි ඇය” තේමාව යටතේ කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා දින වැඩසටහන කටුනායක අපනයන සැකසුම් කලාපයේ සේවිකාවන් 100 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. • එසේම ලංකාවම ආවරණය වන පරිදි කාන්තා දිනයට සමගාමීව කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස්
		5.2	මානව කුට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුලත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික	5.2.1	පසුගිය මාස 12ක කාලය තුලදී, හිංසනයේ ස්වභාවය, සහ වයස අනුව, සහකරුවෙක් සිටි/සිටින, වයස අවුරුදු 15ට වැඩි	

			ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම		කාන්තාවන් සහ ගැහැණු ළමුන් අතරින් කායික, ලිංගික, හෝ මානසික හිංසනයට ලක්වූ ප්‍රමාණය	කාර්යාල 11 විසින් සේවා යෝජකයින් 50 දෙනෙකු බැගින් සහභාගි කරවා ගනිමින් කාන්තාවන්ට බලපාන කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 22 ක් ද පවත්වන ලදි. • කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමේ කොන්දේසි කඩවීම් පිළිබඳව ලැබුණු පැමිණිලි 20 ක් සම්බන්ධයෙන් වර්ෂය තුළදී පරීක්ෂණ සිදු කර අවසන් කරන ලදී. • කාන්තාවන් රාත්‍රී සේවයේ යොදවන ආයතනයන්හි විශේෂ කණ්ඩායම් පරීක්ෂණ ආයතන 201 ක් ආවරණය කරමින් සිදු කරන ලදී. මෙහිදී සේවා කොන්දේසි කඩ කිරීම් 18 ක් වාර්තා වන ලද අතර කොන්දේසි කඩකිරීම් සඳහා එම ආයතන වෙත අවවාද කිරීම් සිදු කරන ලදි.
		5.6.ඇ.	ස්ත්‍රී පුරුෂ සමානත්වය සහ සියලුම මට්ටම්වල කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම,ශක්තිමත් කිරීම සහ නීතිමය ලෙස බලාත්මක කිරීම	5.ඇ.1	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම හඳුනා ගැනීමට සහ රාජ්‍ය මුදල් වෙන් කිරීමක් සහිත ක්‍රමයන් පවත්නා රටවල් ප්‍රමාණය	
8	සියලු දෙනා සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	8.5.	2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම	8.5.1	රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම ඉපැයීම	කම්කරු නීති අනුව පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව හෝ ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් නොවේ.
				8.5.2	ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධ සහිත පුද්ගලයන්ට අදාළව විරැකියා අනුපාතය	

		8.7	බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම	8.7.1.	ස්ත්‍රීපුරුෂභාවය සහ වයස අනුව අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදාගෙන ඇති ප්‍රමාණය සහ සංඛ්‍යාව	• 2025 වර්ෂය වන විට ශ්‍රී ලංකාව ළමා ශ්‍රමයෙන් තොර දේශයක් කිරීමේ තිරසාර අරමුණ පෙරදැරිව ගම්පහ, කළුතර, බදුල්ල සහගාල්ල යන දිස්ත්‍රික්ක 04' ළමා ශ්‍රමයෙන් තොර කලාප' ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහාඑම දිස්ත්‍රික්කයන්ට අදාළව කමිටු පත් කිරීම සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කර වැඩමුළු පැවැත්වීමට කටයුතු සිදු කරන ලදී. • ළමා ශ්‍රමය පිළිබඳව ලද පැමිණිලි 160ක් සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී පරීක්ෂණ සිදු කරන ලදී. ළමා ශ්‍රමයක් ඇති බවට අනාවරණය වූ පැමිණිලි 11 න් 06 ක් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලද අතර ඉන් එක් නඩුවක් අවසන් වී ඇත. ඉතිරි පැමිණිලි 05 සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
		8.8.	කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම, විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුලු සංක්‍රමණිකයින් සහ අවධානම් සහගත රැකියාවල නිරත වුවන් ඇතුලත්ව වැඩ කරන සියලුදෙනා සඳහා	8.8.1.	ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික තත්ත්වය අනුව රැකියාව ආශ්‍රිත මාරක සහ මාරක නොවන අනතුරු සිදුවීමේ අනුපාතයන්	• 2022 වර්ෂය තුලදී සේවා ස්ථාන ආශ්‍රිතව ඇතිවූ මරණීය අනතුරු 66ක් හා මරණීය නොවන අනතුරු 1260 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී ඇත. මෙම අනතුරු විමර්ශනය කර අදාළ නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීමත් අනතුරට හේතු සොයා ගැනීම තුළින් එවැනි අනතුරු නැවත සිදු නොවන

			ආරක්ෂාකාරී සහ ප්‍රවේසම් සහගත සේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය කිරීම	8.8.2 .	ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික මට්ටම් අනුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ලේඛන මූලාශ්‍ර ජාතික ව්‍යවස්ථාව පදනම්ව කම්කරු අයිතිවාසිකම් (රැස්වීමේ සහ සාමූහික කේවල් කිරීමේ නිදහස) සම්බන්ධයෙන් ඇති ජාතික අනුකූලතාවයේ මට්ටම	ආකාරයට කටයුතු කිරීමට සේවායෝජකයින් දැනුවත් කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. ඒ අනුව, කර්මාන්තශාලා ආඥා පනත උල්ලංඝනය වන පරිදි කටයුතු කළ සේව්‍යයන් 263 දෙනෙකුට එරෙහිව වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් නෛතික ක්‍රියා මාර්ග ගන්නා ලදී. • රැස්වීමේ හා කේවල් කිරීමේ නිදහස වර්ධනය කිරීම උදෙසා වෘත්තීය සමිති ඇති කර ගැනීමට, පවත්වාගනෙ යාමට හා ඒ අනුව සිය අයිතිවාසිකම් පිළිබඳ කටයුතු කිරීමට සේවකයන් හට අවස්ථාව ලබා දී ඇත. ඒ අනුව 2022 වර්ෂය තුළදී වෘත්තීය සමිති 143ක් ලියාපදිංචි කරන ලදී. එම සමිතිද ඇතුළත්ව 2022.12.31 දිනට මෙරට වලංගු වෘත්තීය සමිති සංඛ්‍යාව 2053 කි .

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

2022 වර්ෂයේදී පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය, ඉන්ධන අර්බුදය සහ සමාජ ආර්ථික අර්බුද හේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ සිදු කිරීමට ඉලක්කගත ක්‍රියාකාරකම් බොහොමයක අදාළ ඉලක්ක කරා ළඟා වීම අපහසු විය.

සයවන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් පැතිකඩ

6.1.සේවක සංඛ්‍යා කළමනාකරණය

තනතුර	අනුමත සංඛ්‍යාව	2022.12.31 දිනට තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව අනුමත සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස
ජ්‍යෙෂ්ඨ මට්ටම	211	133	78	37%
තෘතිය මට්ටම	668	478	190	28%
ද්විතිය මට්ටම	1753	1718	35	2%
ප්‍රාථමික මට්ටම	489	401	88	18%
එකතුව	3121	2730	391	13%

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

කම්කරු දෙපාර්තමේන්තුවේ සමස්ත මානව සම්පත එක් එක් අංශ සහ කාර්යාල වල මානව සම්පත් අවශ්‍යතාවය අනුව ස්ථානගත කර ඇත. 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ, තෘතිය මට්ටමේ, ද්විතිය මට්ටමේ සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරී පුරප්පාඩු ප්‍රතිශතය පිළිවෙලින් 37% ක්, 28% ක්, 02% ක් සහ 18% ක් වැනි ඉහළ අගයන් හි පැවති නමුත් දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය තුළ පැවති සීමිත මානව සම්පත සාර්ථකව කළමනාකරණය කර ගනිමින් ආයතනික කාර්ය සාධනය වර්ධනය කර ගන්නා ලදී.

6.3 මානව සම්පත් සංවර්ධනය

නිළධාරීන් වෙත දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන පුහුණු වැඩසටහන් තුළින් ඔවුන්ගේ වෘත්තීය දැනුම, හැකියාවන් සහ ආකල්ප වර්ධනය මෙන්ම ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේ ඵලදායීතාවය ප්‍රවර්ධනය ප්‍රධාන වශයෙන් අරමුණු වේ. එසේම දෙපාර්තමේන්තුව සතු සීමිත ප්‍රතිපාදන සහ සම්පත් මනා ලෙස කළමනාකරණය කර ගනිමින් නවීන තාක්ෂණය තම රාජකාරී කටයුතු සඳහා භාවිතා කිරීමට නිළධාරීන් පෙළඹවීමද, මහජනතාවට වඩා සමීප සේවාවක් ලබාදීම සඳහා නිලධාරීන්ගේ භාෂා නිපුණතාවය වර්ධනයද, දෙපාර්තමේන්තුව තුල ඵලදායී අන්තර් සම්බන්ධතා ගොඩනැගීමද මෙම පුහුණු වැඩසටහන් මගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, රාජ්‍ය සේවයේ අත්දැකීම් බහුල, කාර්යක්ෂම සහ තෘප්තිමත් නිලධාරි කණ්ඩායමක් බිහි කිරීම මෙම පුහුණු වැඩසටහන් මගින් සිදු කෙරේ.

2022 වර්ෂය තුළ දෙපාර්තමේන්තු නිලධාරීන් ගේ දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය පහත පරිදි වේ.

වගුව 6. 1 - දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2022								
අ.අ.	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව		වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs.' 000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
		තනතුර	සංඛ්‍යාව		දේශීය	විදේශීය		
සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය විසින් පවත්වන ලද වැඩසටහන්								
1	නායකත්ව පුහුණු වැඩසටහන (රත්නපුර)	විධායක ශ්‍රේණියේ නිලධාරීන්	40	2022.03.25 දින සිට 2022.03.26 දින දක්වා	1,200,000.00		දේශීය	නිලධාරීන්ගේ නායකත්ව ගුණාංග, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ හැකියාව සහ උපායමාර්ගික තීරණ ගැනීමේ හැකියාව වර්ධනය
2	නායකත්ව සහ පෞරුෂ සංවර්ධන පුහුණු වැඩසටහන (කුකුලේගඟ)	සියලුම මට්ටම් ආවරණය වන පරිදි නිලධාරීන්	136	2022.03.09 දින	767,800.00		දේශීය	නිලධාරීන්ගේ නායකත්ව ගුණාංග, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ හැකියාව සහ උපායමාර්ගික තීරණ ගැනීමේ හැකියාව වර්ධනය
3	පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	ජ්‍යෙෂ්ඨ හා තෘතීය මට්ටමේ නිලධාරීන්	120	2022.03.28 දින	18,035		දේශීය	පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ දැනුවත් වීම

4	කර්මාන්තශාලා ආඥා පනත යටතේ නඩු පැවරීම සහ නඩු ගොනු පවත්වාගෙන යාම පිළිබඳ පුහුණු වැඩසටහන	දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු	11	2022.07.26 දින	-		දේශීය (Zoom මාධ්‍යයෙන් පැවැත්වූ වැඩසටහනකි)	කර්මාන්තශාලා ආඥා පනත යටතේ නඩු පැවරීම සහ නඩු ගොනු පවත්වාගෙන යාමේ ප්‍රායෝගික දැනුම වර්ධනය
5	දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු සඳහා මුදල් විෂය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු	11	2022.08.16 දින	-		දේශීය (Zoom මාධ්‍යයෙන් පැවැත්වූ වැඩසටහනකි)	මූල්‍ය කළමනාකරණ දැනුම වර්ධනය
6	කම්කරු නීති සම්බන්ධ සංශෝධන පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු, සහකාර කම්කරු කොමසාරිස්වරු සහ ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන්	68	2022.09.20 දින	-		දේශීය (Zoom මාධ්‍යයෙන් පැවැත්වූ වැඩසටහනකි)	කම්කරු නීති සම්බන්ධ නවතම සංශෝධන පිළිබඳව නිලධාරීන් දැනුවත් වීම
7	මූලික විමර්ශන සිදු කිරීම හා විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන	ප්‍රධාන කාර්යාලයේ සහ බස්. කලාප I, බස්. කලාප II, බස්. කලාප III හි සේවය කරනු ලබන නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් සහ සහකාර කම්කරු කොමසාරිස්වරුන්	46	2022.11.17 දින	21,000.00		දේශීය	මූලික විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ සිදු කිරීම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම

8	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර කම්කරු කොමසාරිස්වරු සඳහා සේවාරම්භක පුහුණුව	සහකාර කම්කරු කොමසාරිස්වරු	07	2022.02.10 දින සිට 2022.02.22 දින දක්වා	48,745.00		දේශීය	රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය දැනුම ලබා දීම සහ සේවාරම්භක පුහුණුව ලබා දීම.
9	කලාප සහ ඒ යටතේ ඇති දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු, සහකාර කම්කරු කොමසාරිස්වරු සහ ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන් සඳහා වන නේවාසික පුහුණු වැඩමුළුව	බස්නාහිර කලාප I, බස්නාහිර කලාප II, සබරගමු කලාපය, දකුණු කලාපයයන කලාප සහ ඒ යටතේ ඇති දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි නිලධාරීන් (නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු, සහකාර කම්කරු කොමසාරිස්වරු සහ ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන්)	28	2022.12.17 දින සහ 2022.12.18 දින	262,550.00		දේශීය	කම්කරු නීති සම්බන්ධ නවතම සංශෝධන පිළිබඳව නිලධාරීන් දැනුවත් වීම සහ සේවක අර්ථසාධක අරමුදල් දත්ත පද්ධති භාවිතය පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම
10	පැමිණිලි කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන	කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු, දිස්ත්‍රික් සහකාර කම්කරු කොමසාරිස්වරු, උප කම්කරු කාර්යාල හාර ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන් එම කාර්යාලයන්හි විෂයභාර නිලධාරීන්	200 (දළ වශයෙන්)	2022.06.16 දින සහ 2022.10.26 දින	-		දේශීය (Zoom මාධ්‍යයෙන් පැවැත්වූ වැඩසටහනකි)	පැමිණිලි කළමනාකරණ පද්ධතිය භාවිතය පිළිබඳ දැනුම වර්ධනය හා ප්‍රායෝගිකව මතුවන ගැටළු සඳහා විසඳුම් සාකච්ඡා කිරීම

11	කම්කරු දෙපාර්තමේන්තුවට ලැබෙන පැමිණිලි හා ඊට අදාළ නඩු කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන	පැමිණිලි හා නඩු විෂයන් සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්	272 (දළ වශයෙන්)	2022.01.27 දින සහ 2022.01.28 දින	13,050.00		දේශීය (Zoom මාධ්‍යයෙන් පැවැත්වූ වැඩසටහනකි)	දෙපාර්තමේන්තුවට ලැබෙන පැමිණිලි හා ඊට අදාළ නඩු කටයුතු විධිමත් පරිදි සිදු කිරීම
12	සංවර්ධන නිලධාරීන් සහ කළමණාකරණ සේවා නිලධාරීන් සඳහා ලිපිගොනු කළමණාකරණ පුහුණු වැඩසටහන	සංවර්ධන නිලධාරීන් සහ කළමණාකරණ සේවා නිලධාරීන්	285	2022.08.19 දින	22,250.00		දේශීය	ලිපිගොනු ක්‍රමවත්ව පවත්වාගෙන යාමේ දැනුම වර්ධනය
13	සේවක අර්ථසාධක අරමුදලේ අධීක්ෂණ දත්ත පද්ධතිය සම්බන්ධයෙන් නිලධාරීන් පුහුණු කිරීම	සේවක අර්ථසාධක අරමුදලේ අධීක්ෂණ පද්ධතිය හා සම්බන්ධව කටයුතු කරනු ලබන නිලධාරීන් (නැගෙනහිර කොළඹ, උතුරු කොළඹ, දකුණු කොළඹ, බටහිර කොළඹ සහ මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන්හි)	10	2022.10.11 දින සිට 2022.10.28 දින දක්වා දින 12ක්	-		දේශීය	සේවක අර්ථසාධක අරමුදල් අධීක්ෂණ පද්ධතිය භාවිතය සම්බන්ධ දැනුම වර්ධනය

14	E-ROC පද්ධතිය සම්බන්ධයෙන් පුහුණු කිරීම	නීති ක්‍රියා, කාර්මික සම්බන්ධතා සහසේවක අර්ථසාධක අරමුදල් යන අංශන්හි සහ බස්නාහිර කලාප I, බස්නාහිර කලාප II, බස්නාහිර කලාප III යන නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාලයන් හි සහ නැගෙනහිර කොළඹ, උතුරු කොළඹ, දකුණු කොළඹ, බටහිර කොළඹ සහ මැද කොළඹ යන දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන් හිඅදාළ නිලධාරීන්	12	2022.09.30 දින	-		දේශීය	අවශ්‍ය අවස්ථාවන්හිදී ලියාපදිංචි සමාගම් පිළිබඳ තොරතුරු E-ROC පද්ධතිය මගින් ලබා ගැනීමේ හැකියාව වර්ධනය
15	සේ.අ.අ. 30% විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ ගෙවීම් සහ මියගිය සාමාජිකයන්ගේ නීතිමය උරුමකරුවන් වෙත ප්‍රතිලාභ ගෙවීම් පිළිබඳ නිලධාරි පුහුණු වැඩසටහන	සේ.අ.අ. 30% විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ ගෙවීම් අංශයේ සහ “L” අංශයේ (මියගිය සාමාජිකයන්ගේ නීතිමය උරුමකරුවන් වෙත ප්‍රතිලාභ ගෙවීම් අංශයේ) නිලධාරීන්	100 (දළ වශයෙන්)	2022.08.17 දින සහ 2022.08.18 දින	-		දේශීය (Zoom මාධ්‍යයෙන් පැවැත්වූ වැඩසටහනකි)	සේවක අර්ථසාධක අරමුදල් අංශයේ සේවාවන් සේවාලාභීන් වෙත වඩාත් කාර්යක්ෂමව ලබා දීම

16	ගබඩා කළමණාකරණය සහ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙනයාම සම්බන්ධ පුහුණු වැඩසටහන	ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරීන් හා විෂය භාර නිලධාරීන්	100 (දළ වශයෙන්)	2022.07.28 දින	3,000.00		දේශීය (Zoom මාධ්‍යයෙන් පැවැත්වූ වැඩසටහනකි)	ගබඩා කළමණාකරණය සහ ඉන්වෙන්ට්‍රි පවත්වාගෙනයාම විධිමත් වීම
17	නඩු ලිපි ගොනුවල තොරතුරු එක් ආකෘති පත්‍රයකට අනුව පරිසණක ගත කිරීම සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	කලාප හා දිස්ත්‍රික් කම්කරු කාර්යාල වල, නඩු කටයුතු සම්බන්ධ විෂය භාර කළමනාකරණ සේවා නිලධාරීන් සහ පරිසණක දැනුම ඇති නිලධාරීන් (එක් කාර්යාලයකින් නිලධාරීන් දෙදෙනකු බැගින්)	100 (දළ වශයෙන්)	2022.05.05 දින	-		දේශීය (Zoom මාධ්‍යයෙන් පැවැත්වූ වැඩසටහනකි)	කම්කරු කාර්යාලවල පවතින නඩු ගොනු පහසුවෙන් කළමනාකරණය කර ගැනීම
18	කාර්යාල සේවක සේවයේ සේවකයින් සහ බහුකාර්ය සංවර්ධන පුහුණුවන්නන් සඳහා සංග්‍රහ සත්කාර පුහුණු වැඩමුළුව	රැස්වීම් සහ උත්සව ආදිය සඳහා සේවා සැපයීමට සම්බන්ධවන කාර්යාල සේවක සේවයේ සේවකයින් සහ බහුකාර්ය සංවර්ධන පුහුණුවන්නන්	23	2022.06.18 දින	48,875.00		දේශීය	නිවැරදි සංග්‍රහ සත්කාර ක්‍රම පිළිබඳ දැනුම වර්ධනය
19	රියදුරු වගකීම් හා ආචාර ධර්ම පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ රියදුරන් පුහුණු කිරීමේ වැඩසටහන - 2022	දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන රියදුරන්	71	2022.01.22 දින	57,480.00		දේශීය	රියදුරු වගකීම් හා ආචාර ධර්ම පිළිබඳව දැනුම යාවත්කාලීන කිරීම

20	බහුකාර්ය සංවර්ධන පුහුණුවන්නන් සඳහාවන පුහුණු වැඩසටහන	බහුකාර්ය සංවර්ධන පුහුණුවන්නන්	18	2022.01.18 දින සිට 2022.01.21 දින දක්වා	10,635.00		දේශීය	රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය දැනුම ලබා දීම
21	රා.පරි.ව. 18/2020 අනුව පවත්වන දෙමළ භාෂා පුහුණු වැඩසටහන්	විධායක ශ්‍රේණියේ නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන්		පැය 200 වැඩසටහන් 01 ක් සහ පැය 150 වැඩසටහන් 04 ක්			දේශීය (භෞතිකව සහ Zoom මාධ්‍යයෙන්)	රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය දෙමළ භාෂා දැනුම වර්ධනය
බාහිර පුහුණු ආයතනයන්හි පුහුණුව සඳහා නිලධාරීන් යොමු කිරීම්								
වැඩමුළු								
22	Essentials in System and Network Administration	සහකාර කම්කරුකොමසාරිස් (සේ.අ.අ. තොරතුරු තාක්ෂණ), තොරතුරු තාක්ෂණ සහකාරවරු, පරිගණක දැනුම ඇති තෝරාගත් කළමනාකරණ සේවා නිලධාරීන් සහ කාර්යාල කාර්ය සහයකවරු	14		395,450.00		දේශීය	කාර්යාලයන්හි පරිගණක නෙට්වර්ක් සම්බන්ධයෙන් මතුවන දෝශ නිරාකරණය
23	ගබඩා කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	සැපයුම් අංශයේ කළමනාකරණ සේවා නිලධාරි	01		18,000.00		දේශීය	සැපයුම් අංශයේ ගබඩා කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම

ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි සඳහා යොමු කිරීම්								
24	Master of Arts in Applied Economics	අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (දෙපාර්තමේන්තු)	01		99,000.00		දේශීය	නිලධාන්ගේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම වර්ධනය වීම
25	සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධිය	නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්	02		107,500		දේශීය	
26	මානව සම්පත් කළමණාකරනය පශ්චාත් උපාධිය	නියෝජ්‍ය කම්කරු කොමසාරිස්	01		210,000.00		දේශීය	
27	Master in Public Administration and Management	සහකාර කම්කරු කොමසාරිස්වරුන්	07		710,000.00		දේශීය	
28	නීතිවේදී පශ්චාත් උපාධිය	නීති නිලධාරි	01		96,500.00		දේශීය	නිලධාන්ගේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම වර්ධනය වීම
29	Master of Law in Bussiness Law	නීති නිලධාරි	01		180,000.00		දේශීය	
30	Diploma in professional English	කම්කරු නිලධාරි	01		40,000.00		දේශීය	

වගුව 6.2 - විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2022					
අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව		වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය රු.
		තනතුර	සංඛ්‍යාව		
01	Courses on Occupational Safety and Health and Labour Inspection 2022 (ILO)	සහකාර කම්කරු කොමසාරිස්	1	2022.02.22 දින සිට 2022.02.24 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
		ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන්	2	2022.05.09 දින සිට 2022.06.01 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
02	Workshop on Enhancing Employee Productivity in the Digital Workplace with reference to the Project Code on 22-CP-14-GE-WSP-A.(Japan)	සහකාර කම්කරු කොමසාරිස්වරුන්	2	2022.02.23 දින සිට 2022.02.25 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
03	Occupational Safety and Health Training (online) WIND and WISE methodologies in plantation sector (India)	පර්යේෂණ නිලධාරීන්	4	2022.02.22 දින සිට 2022.02.24 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
04	Master Trainers For the Introduction of OSH Committees through Better Work Sri Lanka Programme (ILO)	ඉංජිනේරුවන් සහ පර්යේෂණ නිලධාරීන්	11	2022.02.25 දින	මාර්ගගත පුහුණුවකි
05	Workshop on Talent Development for the future of Work (Japan)	සහකාර කම්කරු කොමසාරිස්	1	2022.03.29 දින සිට 2022.03.31 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
06	Certified Penetration Tester by Cybersecurity (Malaysia)	තොරතුරු තාක්ෂණ නිලධාරී	1	2022.05.17 දින සිට 2022.05.24 දින දක්වා	මාර්ගගත පුහුණුවකි

07	ILO - Technical meeting on covid 19 and Sustanable recovery in the Tourism sector 25- 29 April 2022, Geneva – Hybrid (Gineva)	සහකාර කම්කරු කොමසාරිස්	1	2022.04.25 දින සිට 2022.04.29 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
08	Workshop on Womens Entrepreneurship in the Digital Economy (Japan)	සහකාර කම්කරු කොමසාරිස්වරුන්	3	2022.05.11 දින සිට 2022.05.13 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
09	Seminar on Infrastructure Construction and Planning For Sri Lanka	ඉංජිනේරුවන්	2	2022.07.13 දින සිට 2022.07.15 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
10	Women and Youth Entrepreneurship in Water Supply and Sanitation Development Trainers Programme (India)	සහකාර කම්කරු කොමසාරිස්	1	2022.05.17 දින සිට 2022.06.17 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
11	Workshop on the Future of Regulation (Japan)	නියෝජ්‍ය කම්කරු කොමසාරිස්	1	2022.06.29 දින සිට 2022.07.01 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
12	Seminar on Forestry Carbon Sink Management for BRI Countries (China)	ඉංජිනේරු	1	2022.06.27 දින සිට 2022.07.17 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
13	Occupational Health and Safety in the Community (Thailand)	ඉංජිනේරුවන්	2	2022.08.15 දින සිට 2022.09.09 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
14	Workshop on Digital Transformation for the Public Sector (Japan)	සහකාර කම්කරු කොමසාරිස්වරුන්	2	2022.07.13 දින සිට 2022.07.15 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
15	Workshop on Enhancing Service - Sector Productivity With Cloud Solutions (Japan)	සහකාර කම්කරු කොමසාරිස්	1	2022.08.24 දින සිට 2022.08.26 දින දක්වා	මාර්ගගත පුහුණුවකි

16	China Multilateral Programmes	සහකාර කම්කරු කොමසාරිස්වරුන්	2	2022.09.21 දින සිට 2022.09.30 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
17	International Training on Communicating Evidence (ILO)	සහකාර කම්කරු කොමසාරිස් සහ නීති නිලධාරී	2	2022.09.02 දින	මාර්ගගත පුහුණුවකි
18	Workshop on Productivity – Linked Wage Systems in the Service Sector (Japan)	නියෝජ්‍ය කම්කරු කොමසාරිස්	1	2022.08.08 දින සිට 2022.08.10 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
19	Seminar on Industrial Park Construction for Belt and Road	නියෝජ්‍ය කම්කරු කොමසාරිස්	1	2022.08.01 දින	මාර්ගගත පුහුණුවකි
20	Virtual Workshop on Performance Management Systems and Productivity of the Public Sector (Japan)	සහකාර කම්කරු කොමසාරිස්	1	2022.08.24 දින සිට 2022.08. 26 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
21	Workshop on demographic Trends and Their Implications for Productivity	සහකාර කම්කරු කොමසාරිස්	1	2022.09.14 දිනසිට 2022.09.16 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
22	AIBO - Seminar on 5G Technology Standard and Application	නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්	2	2022.09.21 දින සිට 2022.09.30 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
23	Good Governance for Management of Rural Development Programme	සහකාර කම්කරු කොමසාරිස්	1	2022.11.01 දින සිට 2022.11.28 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
24	Multicountry Observational Study Mission on Productivity and Innovation for the Digital Economy	කම්කරු කොමසාරිස් ජනරාල්	1	2022.12.20 දින සිට 2022.12.22 දින දක්වා	

25	Training Course on strategic Management for Public Sector Productivity Enhancement	සහකාර කම්කරු කොමසාරිස්	1	2022.10.25 දින සිට 2022.10.28 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
26	Regional Consultation to Finalize the Draft Regional Action Plan to End All Forms of Child Labour in South Asia 2021-2025	නියෝජ්‍ය කම්කරු කොමසාරිස්	1	2022.12.15 දින සිට 2022.12.16 දින දක්වා	මාර්ගගත පුහුණුවකි
27	High - Level International Forum on Labour Inspection (Valencia, Spain)	කම්කරු කොමසාරිස් ජනරාල්	1	2022.11.17 දින සිට 2022.11.18 දින දක්වා	

සත්වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව				
අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ - ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	දැනට 1978.12.19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සිගාස් වැඩසටහන තුළ මොඩියුලයක් සකසා ඇති බැවින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම අනිවාර්ය නොවේ. ඒ අනුව, සිගාස් වැඩසටහන තුළ මොඩියුලයක් පවත්වා ගනී.	
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම සාරාංශ (CIGAS) පිලියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA—N20) යාවත්කාලීන කර පවත්වාගෙන යා	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිලිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		

4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණනය සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකට ම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අදාළ කාර්යාල වලින් පිළිතුරු ලැබීමේදී මසකට වඩා කාලයක් ගතවීම.	අදාළ අංශ හා කාර්යාල දැනුවත් කර ඇත.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA වක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම	අනුකූල වේ		

8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝල් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත , ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ (අදාළ දෛනික ධාවන සටහන් පත් ඉල්ලුම් කළ විට ඉදිරිපත් කරන ලෙසට රජයේ විගණකාධිපති විසින් වාචිකව දැනුම් දී ඇති අතර ඒවා ලැයිස්තුගත කර ගබඩා කර ඇත.)		

9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ.	වාහන අපහරණය කිරීම සඳහා මෝටර් රථ පරීක්ෂණ නිළධාරියකුගෙන් සමන්විත කමිටුවක් පත් කළ යුතු අතර එම කමිටුව පත් කර අපහරණ ක්‍රියාවලිය සඳහා යම් කාලයක් ගතවීම.	ගර්හිත වාහන හඳුනාගත් වහාම කමිටුව පත් කර අපහරණය සිදු කිරීමට කටයුතු කිරීම.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	2022 වර්ෂයෙහි රටෙහි පැවති ඉන්ධන හිඟය හා QR භාවිතය මත පමණක් ඉන්ධන නිකුත් කිරීම හේතුවෙන් ඉන්ධන දහන ක්‍රියාවලිය සිදු කිරීම ප්‍රමාද වී ඇති අතර මෙම වසර තුළ දී සිදු කර වාර්තා ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දී ඇත.	
9.6	කල්බදු කාල සීමාවන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහ ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල්	අනුකූල වේ		

	රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම			
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවයේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි , බැරකම් වලට ඵලඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	නිහඟිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන නිහ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	රු. 731,661.50 ක ශේෂ අය කර ගැනීමට නඩු පැවරීම සඳහා නීති ක්‍රියා අංශය වෙත යොමු කර ඇත. එසේම, පහත හේතූන් මත ණය ශේෂ අයකර ගැනීමට නොහැකි වී ඇත. • ඇතැම් ණය ශේෂයන්ට අදාළ ලිපිගොනු නොමැති වීම. (රු. 63,249.25ක ශේෂයක් සඳහා) • සේවය හැර ගිය, සේවයෙන් පහ කළ, සේවය අවසන් කළ ඇතැම් නිළධාරීන්ගේ ලිපිනයන් තහවුරු කර ගත නොහැකි වීම. • ශේෂ අය කර	• ණය ශේෂ පියවන ලෙස අදාළ නිළධාරීන් වෙත සිහි කැඳවීම් යැවීම. • ලිපිනයන් තහවුරු කර ගත නොහැකි නිළධාරීන්ගේ ණය ශේෂ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මැතිවරණ දෙපාර්තමේන්තුව වෙතින් ලිපිනයන් තහවුරු කර ගැනීමට කටයුතු කිරීම. • නඩු පැවරීමට කටයුතු කිරීම. • ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.

			ගැනීමට නඩු පැවරීමේදි නඩු පැවරීමට රජයට දැරීමට සිදුවන වියදම, අය කර ගැනීමට ඇති මුදල අහිබවා යන බැවින් නඩු පැවරීමට කටයුතු කිරීම නිශ්ඵල ක්‍රියාවක් බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබීම හේතුවෙන් නඩු පැවරීමට නොහැකි වීම. • ඇපකරුවන් පිළිබඳ විස්තර නොමැති වීම හා ඇතැම් ණය ශේෂ සඳහා ඇපකරුවන් නොමැති වීම. (රු.395,272.81 ක ශේෂ සඳහා) • මියගිය නිළධාරීන්ගේ ශේෂයන් මරණ පාරිතෝශිකයෙන් අය කර ගැනීමට අදාළ ලේඛන උරුමකරුවන් විසින් ඉදිරිපත් කර නොතිබීම.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		

14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කරන ලද තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිමය නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**	දෙපාර්තමේන්තුව සඳහා අදායම් ගිණුමක් නැත.		
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කරන ලද ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නැත		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නැත		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාළ නැත		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ (අදාල අංශ සහ කාර්යාල විසින් සකස් කරනු ලබයි)		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

17.2	ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිලිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා යොමු කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලීම් සඳහා තොරතුරු ලබා දීම ප්‍රාදේශීය කාර්යාල මගින් සිදු කරනු ලබයි. ඒ අනුව, එම තොරතුරු එක්රැස් කර ගැනීම සඳහා කාලයක් ගත වීම.	තොරතුරු දැනගැනීම පනත යටතේ මාසිකව නිකුත් කරන ලද තොරතුරු සම්බන්ධ වාර්තාවක් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලෙස සියලු ප්‍රාදේශීය කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කර ඇත.
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය කෙටුම්පත් කර ඇති අතර ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට නියමිතය.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි , පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කිරීම	අනුකූල නොවේ	ක්‍රමවේදයක් කෙටුම්පත් කර ඇත.	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		

19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම අත්සන් කර තිබීම	අනුකූල නොවේ	2022.12.31 දිනට දෙපාර්තමේන්තුවේ තනතුරු 70ක් සඳහා 2730ක කාර්ය මණ්ඩලයක් ප්‍රධාන කාර්යාලයේ අංශවල සහ දීප ව්‍යාප්තව පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාලවල සේවයේ නියුතුව සිටින අතර එම නිලධාරීන් සියලු දෙනා සඳහා දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම සංකීර්ණ කාර්යයක් බැවින් එය සිදු කරන ආකාරය පිළිබඳව අධ්‍යයනය කරමින් පවතී.	
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානය